





# වාර්ෂික වාර්තාව -2013

# ජාතික රක්ෂණ භාර අරමුදල

# පටුන

පිටු අංකය


| | |
|---|---|
| 01. සමායතනික දර්ශනය | 3 |
| 02. ඉලක්ක සහ අරමුණු | 7 |
| 03. ජාතික රක්ෂණ භාර අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලය - 2013 | 10 |
| 04. සභාපතිගේ සමාලෝචනය | 12 |
| 05. කළමනාකරණ සාකච්ඡාව සහ විශ්ලේෂණය | 14 |
| 06. තිරසාර වාර්තාකරණය | 33 |
| 07. පාලන වාර්තාකරණය - ව්‍යවසාය පාලනය | 37 |
| 08. පාලන වාර්තාකරණය සහ ව්‍යවසාය අවදානම් කළමනාකරණය | 46 |
| 09. මූල්‍ය ප්‍රකාශ 2013 | 53 |
| 10. විගණන වාර්තාව | 67 |
| 11. අට වසරක අවලෝකනය | 81 |
| 12. සමායතනික තොරතුරු | 84 |



# 1. සමායතනික දර්ශනය




## දැක්ම

**ආරක්ෂාව අවැසි සියළු අංශයන්ට රැකවරණය හා ආරක්ෂණ ජාලයක්**



## මෙහෙවර

- සමාජයෙහි අගහිඟකම්වලින් පෙළෙන සියළුම අංශයන් අරබයා දැරිය හැකි කාර්යක්ෂම හා ප්‍රගතිශීලී රක්ෂණ ක්‍රම

- වෙනස් වෙමින් පවත්නා අවශ්‍යතාවන් තුළින් පැන නඟින ඉහළ අවදානම් ආවරණය කරනු පිණිස සම්පත් ඒකරාශී කිරීම් හා වෙනත් වැඩපිළිවෙලවල් තුළින් දේශීය වෙළෙඳපොලට විසඳුම් සලසාලීම.

- දේශීය රක්ෂණ වෙළෙඳපොලට අතිරේක ශක්‍යතාවය සලසාලීම සඳහා ශ්‍රී ලංකාව තුළ ප්‍රතිරක්ෂණ වෙළෙඳපොලක් නිර්මාණය කිරීම

තුළින් ශ්‍රී ලංකාවේ සමාජමය හා ආර්ථික සංවර්ධනයට සහභාගී වීම.

# සමායතනික වටිනාකම්




- විශ්වාසනීය බව
- අවංකත්වය
- වගකීම
- මූල්‍ය ස්ථාවරත්වය
- වෘත්තීය කළමණාකරනය



# 2 ඉලක්ක හා අරමුණු

- සියළුම සමාජයීය කොටස් ආවරණය කෙරෙන අපේක්ෂිත ඉලක්කගත කණ්ඩායම්වල යහසාධනය අරබයා රක්ෂණ ක්‍රම ක්‍රියාවට නංවාලීම

- ප්‍රතිරක්ෂණ වෙළෙඳපොළෙහි යටත් පිරිසෙයින් සියයට 50ක් ග්‍රහණය කරගනු පිණිස ප්‍රතිරක්ෂණ ක්‍රමයක් සැලසුම්කොට ක්‍රියාවට නංවාලීම

- ජාතික රක්ෂණ භාර අරමුදල මගින් ක්‍රියාත්මක කෙරෙන සියලුම රක්ෂණ ක්‍රම ස්වයංකරණය කිරීම


- සියලුම ප්‍රතිලාභීනට අතිශයින් කාර්යක්ෂම සේවාවක් සලසාලනු පිණිස මානව සම්පත් සංවර්ධනය කිරීම

- ඉදිරි පස් වසරක කාලසීමාව තුළදී පාර්ශවකරුවන්ට උපරිම ප්‍රතිලාභයක් අත්කර දීම සඳහා ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ආයෝජන ඵලදායීව කළමනාකරණය කිරීම

- රක්ෂණ ක්‍රමයන්ට සහභාගිවන්නන් දැනුවත් කරලීමේ අධ්‍යාපන වැඩ සටහන් මාර්ගයෙන් ප්‍රවර්ධනය කිරීම සහ දිරිමත් කිරීම

- ජාතික රක්ෂණ භාර අරමුදලෙහි ඉදිරි මෙහෙයුම් කටයුතු පහසු කරලීම සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම

- අවදානම් කළමනාකරණ ඒකකයක් පිහිටුවාලීම සහ ක්ෂේත්‍ර අධ්‍යයනයක් පැවැත්වීම සඳහා සිය ඉදිරි රක්ෂණ ක්‍රියාකාරකම් පිළිබඳව ජාතික රක්ෂණ භාර අරමුදලට මග පෙන්වීම



# 3. ජාතික රක්ෂණ භාර අරමුදලේ සාමාජික මණ්ඩලය - 2013



ඩී. විදානගමාච්චි මහතා

සභාපති



ජේ. දඩල්ලගේ මහතා

(මණ්ඩල සාමාජික)



වෛද්‍ය ලෝහිත සමරවික්‍රම මහතා

(මණ්ඩල සාමාජික)



ඩබ්.එච්. පියදාස මහතා

(මණ්ඩල සාමාජික )




එන්. කුලසේකර මහතා

(මණ්ඩල සාමාජික)



ඒ.කේ. සෙනෙවිරත්න මහතා

(මණ්ඩල සාමාජික)



# 4. සභාපතිවරයාගේ සමාලෝචනය

**වාර්ෂික වාර්තාව-2013 පිළිගැන්වීම**

සිය මෙහෙයුම්හී අටවැනි වසරේ එනම් 2013 දෙසැම්බර් 31 න් අවසන් වන වසර වෙනුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලේ වාර්ෂික වාර්තාව-2013 ඉදිරිපත් කිරීමට ලැබීම මට මහත් සතුටකි.

**සාර්ව ආර්ථික පරිසරය**

**2012 වසරේ ආර්ථික වර්ධනය ලෙස පැවති 6.4% ට සාපේක්ෂව අදාල වසරේ ආර්ථිකය 7.2%ක වර්ධනයක් අත් කරගෙන තිබේ. සේවා අංශය 6.4% ක වර්ධනයක් අත්කර ගනිද්දී බැංකු, රක්ෂණ හා දේපල වෙළඳාම් අංශ 5.9%ක වර්ධනයක් වාර්තා කළේය. කෙසේ වෙතත් 2012 වසරේ පැවති 11% ක වර්ධන අනුපාතය හා සසඳන විට 2013 වසරේ රක්ෂණ කර්මාන්තයේ වර්ධන අනුපාතය 8%ක් ලෙස සාපේක්ෂ පහල මට්ටමක පැවතීම තරමක පසුබෑමකි.**

මේ මද වර්ධන තත්වය ජීවිත නොවන රක්ෂණ අංශයේදී වඩා විද්‍යාමානය. එහිදි වර්ධන අනුපාතයේ එම පහත වැටීම 15% සිට 7% දක්වා වන අතර වාහන ආනයනයේ සහ පුද්ගලික අංශයේ ණය මුදල් යෝජනය සම්බන්ධයෙන් පැවති පහල වර්ධන අනුපාතය ප්‍රධාන වශයෙන්ම ඊට හේතු වෙයි.

**කාර්යසාධනය හා දායකත්වය**

මද වේගී වර්ධනයක් අත්විඳිමින් සිටි රක්ෂණ වෙළඳපලක් තුළ ස්වකීය මෙහෙයුම් කරමින් වුව ජාතික රක්ෂණ භාර අරමුදල නියාමන ක්‍රියාකාරීත්වය තුළින් වාරික ආදායම 33.5% කින් ඉහල නංවා ගැනීමට සමත්ව සිටී. ආදායම වර්ධනය කිරීමේලා ප්‍රධාන දායකයන් වූයේ අනිවාර්ය කොටස 20% සිට 30% දක්වා ඉහල දැමීම තුළ ප්‍රතිරක්ෂණ වාරික වර්ධනය, අනුපාත සංශෝධනය මත අග්‍රහාර යෝජනා ක්‍රමයේ සාමාජිකයන් විසින් කරන ලද දායකත්වයන් වර්ධනය වීම හා අලුතින් හඳුන්වාදෙන ලද කෘෂි රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ගලා ආ නව ආදායම් ප්‍රවාහය යන සාධකයන්ය..

එසේම ජාරභා අරමුදල විසින් උත්පාදනය කරන ලද ලාභයද ඊට අනුරූපීව රු.බිලියන. 4.24 දක්වා ඉහල නැගුණේ අරමුදලට රු.බිලියන 3.2ක් ඒකාබද්ධ අරමුදලට මාරු කිරීමට හැකියාව ලබා දෙමිනි.

ඇගයුම

සිය මාර්ගෝපදේශනයන් හා සහය වෙනුවෙන් මේ ආයතනය තමන් යටතේ පාලනය කරන ගරු අග්‍රාමාත්‍ය සහ ජාතික සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යතුමා හට මෙන්ම රාජ්‍ය අමාත්‍යතුමන් හා ලේකම්තුමා හට මගේ කෘතවේදීත්වය පිරිනැමීමට මම මෙය අවස්ථාව කරගනිමි.සිය බොහෝ කාර්යයන්හිදී ජාරභා අරමුදල සමග සමීප අන්තර්සබඳතා පවත්වා ගත් මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා හා සියළුම කාර්ය මණ්ඩලයේ සහයෝගයද මම මෙහිදී සිහිපත් කරමි. තවද රක්ෂණ කර්මාන්තය නියාමනයේ යෙදෙන ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ සභාපතිනිය, අධ්‍යක්ෂ ජනරාල්සහ අනෙක් නිලධාරීන්ටද මගේ කෘතවේදීත්වය මෙයින් පල කරනු කැමැත්තෙමි.

අවසාන වශයෙන් අරමුදලේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මගේ සහෝදර සාමජිකයන්ට, අපේ ප්‍රධාන විධායක නිලධාරී හට මෙන්ම කාර්ය මණ්ඩලයේ අනෙක් සියළු සාමාජිකයන්ට තම කැපවීමෙන් යුත් සේවාව වෙනුවෙන් ස්තුති කරනු කැමැත්තෙමි.

අත්සන් කළා

මංජුල ද සිල්වා

සභාපති.

**2015.06.23**



# 5. කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

# 5.1 කළමනාකරණ සාකච්ඡා සහ විශ්ලේෂණය

## රක්ෂණ කර්මාන්තය පිළිබඳ සමාලෝචනය

2013 වසරේ ජාතික රක්ෂණ භාර අරමුදල ඇතුළුව(ජා.ර.භා. අ.) තරගකාරී ආයතන 21ක් රක්ෂණ කර්මාන්තය තුළ සක්‍රියව සිටියේය. පෙර වසරේ ලිඛිත දළ මුළු වාරික ප්‍රමාණය වූ රු. මිලියන 87,171 හා සසඳන විට රක්ෂණ සමාගම් විසින් වසර තුළ උත්පාදනය කරන ලද ලිඛිත දළ මුළු වාරික ප්‍රමාණය රු. මිලියන 94.483ක් දක්වා වර්ධනය වී ඇත. රක්ෂණ සමාගම් විසින් සහතික කරන ලද පරිදි ජා.ර.භා. අරමුදලට අයත් වැඩ වර්ජන, කැරලි කෝලාහල,සිවිල් අරගල, සහ ත්‍රස්තක්‍රියා අරමුදල රු. මිලියන 3,107 දක්වා වර්ධනය වී ඇති අතර 2013 වසරේදී සමුච්චිත මුළු දළ වාරික ප්‍රමාණය රු. මිලියන 97,590ක් වී ඇත.( 2012 වසරේදී රු. මිලියන 89,410කි) 2012 වසරේ වාර්තාගත ප්‍රතිශතය හා සසඳන විට 2013 වසරේදී රක්ෂණ කර්මාන්තය ලිඛිත දළ මුළු වාරික අනුපාතයේ 8.39%ක වර්ධනයක් වාර්තා කර ඇත. එසේම දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ රුපියල් මිලියන 41,306ක වාරික ආදායමක් වාර්තා කර ඇති අතර වසරින් වසර 10.22% කින් වර්ධනය වී ඇත. 2013 වසරේ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය තුළ වාරික ආදායම් වර්ධනය ප්‍රධාන වශයෙන්ම විවිධ ප්‍රාරක්ෂණ හා නිෂ්පාදන උපාය මාර්ග මගින් සිදුව ඇති අතර සමාගම් අවධානය යොමු කර ඇත්තේ ආයෝජන, ඉතුරුම් හා විශ්‍රාම හා බැඳුන නිපැයුම් කෙරෙහිය. ලිඛිත දළ මුළු වාරික ප්‍රමාණයෙන් 56.28% ක කොටසක් සහිතව පෙර වසරවලදී මෙන්ම මෙවසරේදීද සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය වෙළඳපල පාලනය කර තිබේ. 2012 වසරේදී වාර්තාකරන ලද රුපියල් මිලියන 49,694ක වාරික ආදායම හා සසඳන විට 2013 වසරේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය විසින් වාර්තාකරන ලද වාරික ආදායම රුපියල් මිලියන 53,177 කි. සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ලිඛිත දළ මුළු වාරික ප්‍රමාණය වසරින් වසර 7.01%කින් වර්ධනය වී තිබේ.රක්ෂණ වාරික සේ ප්‍රකාශයට පත්වන රක්ෂණ ව්‍යාප්තිය ප්‍රතිශතයක් වශයෙන් ගත් කළ 2013 වසරේදී දළ දේශීය නිෂ්පාදනයෙන් 1.09කි. දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යාප්තිය 2013 වසරේදී 0.48කි.(2012.0.49) එය පෙර වසරේ තත්වය හා සසඳන විට මද පහත වැටීමක් වාර්තා කරයි. එනමුදු පසුගිය වසර පහ තුළ දිගු කාලීන රක්ෂණ ව්‍යාපාරය පරම කොන්දේසි යටතේ වර්ධනය වී තිබේ. සාමාන්‍ය ජනයා රක්ෂණය කෙරේ දක්වන ආකල්ප, දැනුවත්භාවයේ මද බව, ප්‍රතිපත්ති කළමණාකරණයේ අකාර්යක්ෂමතාව වැනි විවිධ හේතු මත සාපේක්ෂව ගත්කළ දිගුකාලීන රක්ෂණ ව්‍යාපාරය පහත බැස තිබේ. 2012 වාර්තාගතව පැවති 0.66 අගය ගත් විට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරයේ ව්‍යාප්තිය 2013 දී 0.61 දක්වා පහත බැසීමක් පෙන්වයි.


## ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්යභාරය

සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රම, සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රම හා ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රම වැනි විවිධ රක්ෂණාවරනයන් සපයමින් ජාරභා අරමුදල රටේ ආර්ථික සංවර්ධනයට දායකවී තිබේ. ශ්‍රී ලංකාවේ ප්‍රධාන සංවර්ධන ක්‍රියාවලීන් සම්බන්ධයෙන් වග කියනා රාජ්‍ය සේවයේ ශ්‍රම බලකාය හා රටට විදෙස් විනිමය උපයා දෙන විදෙස්ගත ශ්‍රම බලකාය වෙනුවෙන් නිර්මිත සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය රටේ ශ්‍රම බලකායෙන් විශාල කොටසක ගේ සෞඛ්‍ය ආරක්ෂණය වෙනුවෙන් කටයුතු කරයි. ප්‍රතිරක්ෂණ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම මගින් ජාරභා අරමුදල ප්‍රතිරක්ෂණය වෙනුවෙන් විදෙස් රටවලට ඇදී යන විදෙස් විනිමය ඉතිරි කර ගැනීමට සමත් වී ඇති අතරම ප්‍රමුඛ රක්ෂණ සමාගම් හි විශාල ප්‍රමාණයේ හිමිකම් ඉල්ලීම් වලින් කොටසක් අවශෝෂණය කර ගැනීමටද සමත්ව සිටී. තවද වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල,හා ත්‍රස්තවාදී ක්‍රියා අරමුදල මගින් වැඩ වර්ජන, කැරළි කෝලාහල, සිවිල් අරගල,හා ත්‍රස්තවාදී ක්‍රියා අවදානමට උර දීමට හැකිව තිබේ.

2013 වසරේ ඉදිරිපත් කරන ලද අයවැය යෝජනාවන් හි කොටසක් ලෙස නියඟය හා ගංවතුර වැනි ස්වාභාවික ආපදා හේතුවෙන් බෝගයන්ට සිදුවන හාණි වලින් ගොවියා ආරක්ෂා කරනු පිණිස වගා රක්ෂණ ක්‍රමයක් ස්ථාපිත කිරීමට යෝජනා කරන ලදී. පොහොර සහනාධාර ක්‍රමය යටතේ පොහොර බෑගයකින් රු. 150 බද්දක් හා සියළු බැංකු, මූල්‍ය සමාගම් හා රක්ෂණ **සමාගම්** වල බදු අඩු කළ පසු ලාභයෙන් 1% ක් අය කිරීම මගින් තත් කාර්යය සඳහා ආදායම ලබා ගත හැකි මූලාශ්‍ර දෙකක් හඳුන්වාදෙන ලදී. 2013 වසරේ මැද භාගයේ සිට මේ යෝජනා ක්‍රමය ගැන ප්‍රචාරණය කිරීමේ කටයුත්ත ජාරභා අරමුදල වෙත පවරන ලදී.


## 5.2.1 අට වසරක මූල්‍ය සමාලෝචනය

ප්‍රස්ථාරය 5.01: ශුද්ධ ලාභයේ කාලීන ප්‍රවණතාවය




2009 වසර තෙක් වසර හතරක් පුරා ශුද්ධ ලාභ රටාවෙහි වර්ධන ප්‍රවණතාවක් දක්නට ලැබුණ අතර ඉන් අනතුරුව 2010 වසරේදී ත්‍රස්තවාදී රක්ෂණාවරනයන් සඳහා ඉල්ලුමේ පහල වැටීම හේතුවෙන් එහි සැලකිය යුතු අඩුවීමක් විද්‍යාමාන විය.2010 ට සාපේක්ෂව 2011 වසරේදී එහි 7%කින් මද පහත වැටීමක් පැවතිණ. 2011-2012 අතරතුර ද එහි මද පහත වැටීමක් පැවතිණි. ඉන් පසුව එහි දක්නට ලැබුණේ ඉහල යෑමකි.

ප්‍රස්ථාරය - 5.02: සමුච්චිත අරමුදලේ කාලීන ප්‍රවණතාවය




2010 දක්වා සමුච්චිත අරමුදල රුපියල් මිලියන 9,695 දක්වා වර්ධනය වූ අතර 2010 වසරට සාපේක්ෂව බලන කල එහි 12%කින් පහත වැටීමක් 2011 වසරේදී දක්නට ලැබුණේය. තවද අරමුදල 2012 වසර අවසන වන විට රුපියල් මිලියන 5,913 දක්වා පහත වැටුණි. ඒකාබද්ධ අරමුදලට මාරු කරන ලද රඳවා ගත් ලාභය, 2012 වසරේදී උපයාගත් ශුද්ධ වාර්ෂික ලාභය ඉක්මවූ අගයක් ගැනීමේ ප්‍රතිඵලය ලෙස සමුච්චිත අරමුදල පහත වැටුණි. නමුත් 2013 දී නැවත අරමුදලේ වර්ධනයක් දැකිය හැක.

## 5.2.ආයෝජන සහ ඉතුරුම් සමාලෝචනය

2012 වසර හා සසඳන විට 2013 වසරේදී ජාතික රක්ෂණ භාර අරමුදලේ මුළු ආයෝජන ආදායම 12.29%කින් වර්ධනය වූවේය. මේ ආදායම වනාහී ජාතික රක්ෂණ භාර අරමුදලේ දෙවන ආදායම් මූලාශ්‍රයයි. මුළු ආදායමින් 11.33% ක් ඉන් නියෝජනය වේ.

අරමුදලේ මුළු ආයෝජන රුපියල් බිලියන 6.6 දක්වා වර්ධනය වූ අතර අනුරූපී කාල පරිච්ඡේදය සමග බලන කල ඒ 24%ක වර්ධනයකි.අරමුදලේ වැඩි ප්‍රමාණයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කරන ලදී. ඉතිරි මුදල් 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පණත මගින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ අනුව ශිවිසුම් ප්‍රතිමිලදී ගැනීම් සඳහා ආයෝජනය කරන ලදී. 2013 දෙසැම්බර් 31 දිනට රුපියල් බිලියන 8.7 ක මුළු වත්කම් ශේෂයක් ඇතිවන පරිදි අරමුදලේ මුළු වත්කම් 21.06% කින් වර්ධනය වූවේය.

# රක්ෂණ යෝජනා ක්‍රම පිළිබඳ සමාලෝචනය

**i. රජයේ සේවකයන් පිණිස වන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය (අග්‍රහාර)**

රජයේ නිලධාරීන්ගේ හිතසුව පිණිස 1997 දී ස්ථාපිත කරන ලද වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය අග්‍රහාර සෞඛ්‍ය රක්ෂණ ක්‍රමය ලෙස හැඳින්වේ. එහි මෙහෙයුම් ආරම්භ කරන ලද්දේ මාසිකව සාමාජිකයාගෙන් රුපියල් 11 බැගින් අය කරමිනි. පසුව 2005 වසරේ රජය විසින් ගන්නා ලද තීරණයකට අනුව විශ්‍රාම වැටුප් හිමි සියළු රාජ්‍ය සේවකයන් ගේ මාසික වැටුපෙන් රුපියල් 75 බැගින් රක්ෂණ ක්‍රමයට අය කරගන්නා ලදී. ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව පුද්ගලීකරණය කරන තෙක් රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරන ලද්දේ ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගිනි. එහෙත් එය පුද්ගලීකරණය කිරීමත් සමගම 2006 ජනවාරි 1 සිට බල පැවැත්වෙන පරිදි රජය යෝජනා ක්‍රමය පවරා ගත් අතර ඉන්පසු එය ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ වෙනම රජයේ යෝජනා ක්‍රමයක් ලෙස ක්‍රියාත්මක වේ.

**ii වර්ජන, කැරළි කෝලහාල හා සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල**

**ශ්‍රී ලංකාවේ භූමි ප්‍රදේශය තුළ වර්ජන, කැරළි කෝලහාල හා සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දේපලකට වන හාණි/ පාඩු සහ/හෝ පුද්ගල සෞඛ්‍ය, හදිසි අනතුරු, ශාරීරික තුවාල වෙනුවෙන් ආවරණ පුළුල් කිරීමේ අරමුණින් අමාත්‍ය මණ්ඩලය විසින් ගන්නා ලද තීරණයකට අනුව 1987 වසරේදී වර්ජන, කැරළි හා සිවිල් කෝලහාල සහ ත්‍රස්තවාදී අරමුදල පිහිටුවනු ලැබිණි. 1987 වසරේ සිට අරමුදල පරිපාලනය කරන ලද්දේ ජාතික රක්ෂණ සංස්ථාව විසිනි. ජාතික රක්ෂණ සංස්ථාව ජනශක්ති රක්ෂණ සමාගමට පවරා ගත් පසු 2005.08.01 දින සිට අරමුදල පරිපාලනය කරන ලද්දේ මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසිනි. පසුව ජාරහා අරමුදල සමග සංස්ථාපිතව වැඩ වර්ජන, කැරළි හා සිවිල් කෝලහාල සහ සිවිල් අරගල ත්‍රස්තවාදී අරමුදල යටතේ පැවති සියළු මුදල් ජාරහා අරමුදල යටතට ගනු ලැබිණි. අනතුරුව එම මුදල් ජාරහා අරමුදල විසින් පවත්වා ගෙනයනු ලබන විශේෂ ගිණුමකට මාරු කරන ලදී.**

**iii. සභිකයන් උදෙසා වන රක්ෂණ යෝජනා ක්‍රමය**

**ජාතික රක්ෂණ භාර අරමුදල විසින් පාර්ලිමේන්තු සභිකයන් උදෙසා රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මේ යෝජනා ක්‍රමය යටතේ පාර්ලිමේන්තු සභිකයන් 225 දෙනා හටම ප්‍රතිලාභ සැලසේ. මෙකී යෝජනා ක්‍රමය මගින් පාර්ලිමේන්තු සභිකයන් හට පහත දැක්වෙන ප්‍රතිලාභ සැපයේ.**

1. රු.මි. 5 දක්වා වන හදිසි අනතුරු රක්ෂණාවරන

| | |
|---|---|
| හදිසි අනතුරු වලින් වන මරණ | රු. 5,000,000.00 |
| හදිසි අනතුරු හේතුවෙන් වන පූර්ණ අකර්මණ්‍යතා | රු. 5,000,000.00 |

2. වාර්ෂික වෛද්‍ය රක්ෂණාවරන රු. 200,000.00

**iv. ශ්‍රී ලංකාවේ රක්ෂණ කර්මාන්තය සඳහා ප්‍රතිරක්ෂණාවරනය**

**ජාරහා අරමුදල් පණතේ විධිවිධාන අනුව යමින් ජාතික රක්ෂණ භාර අරමුදල ශ්‍රී ලංකාවේ ප්‍රතිරක්ෂණ අවදානම භාරගැනීම 2006 වසරේදී ආරම්භ කළේය. ශ්‍රී ලංකාවේ සාමාන්‍ය රක්ෂණ සමාගම්වල ප්‍රතිරක්ෂණ ව්‍යාපාර කටයුතු මුළු ප්‍රමාණයෙන් 30%ක් ජා.ර.භා. අරමුදලට ලබා ගැනීම අනිවාර්යය වේ.**

**v. මෝටර් වාහන රක්ෂණ යෝජනා ක්‍රම (**රජය සතු වාහන සඳහා**)**

රජයේ ආයතනයන්ට හිමි මෝටර් වාහන(මනාපය පරිදි) හා අර්ධ රාජ්‍ය ආයතනයන්ට හිමි වාහන (මනාපය පරිදි) වලට සිදුවිය හැකි හානි සහ පාඩු වෙනුවෙන් රක්ෂණය කරනු ලබයි. ආරම්භයේදී ජාතික රක්ෂණ භාර අරමුදල විසින් රාජ්‍ය අංශයට මෝටර් වාහන රක්ෂණ පිරිනමනු ලැබූ අතර ඉන් අනතුරුව දැරිය හැකි වාරික යටතේ අදාල සේවා පුද්ගලික අංශයටද පිරිනමන ලදී. එහි විස්තීර්ණ මෝටර් වාහන රක්ෂණය යටතේ ගින්නෙන්, සොරකම් වලින් සිදුවන හානි සහ තෙවන පාර්ශවයන්ට සිදුවන හාණි(මරණ හා තුවාල) ආවරණය කරන අතරම ගංවතුර,වර්ජන,කැරළි කෝලහාල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී ක්‍රියා වැනි අතිරේක හානි සම්බන්ධයෙන්ද ආවරණ සැපයේ. වර්තමානයේදී ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රධාන

වශයෙන්ම අවධානය යොමු කරන්නේ රාජ්‍ය අංශයේ රක්ෂණ අවශ්‍යතා වෙනුවෙන් සේවය කිරීමටය.

### vi "විදේශ රැකියා" විදෙස් රැකියා රක්ෂණ යෝජනා ක්‍රමය

2008 ජූනි මාසයේ සිට විදෙස්ගතව රැකියා කරනා ශ්‍රී ලාංකිකයන් සඳහා වන විදෙස් රැකියා රක්ෂණ යෝජනා ක්‍රමය මගින් ජාතික රක්ෂණ භාර අරමුදල වෙතින් රක්ෂණාවරනයක් ලබාගෙන විදෙස් රැකියා පිණිස යන වයස 18-65 අතර ශ්‍රී ලාංකිකයනට ආවරණ සපයනු ලැබීය. කෙසේ වෙතත් මෙය 2012 වසරේ සිට නතර කර ඇත.

### vii සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය

2009.08.20 දිනැතිව නිකුත් කරන ලද අංක 1615/20 ගැසට් නිවේදනය ප්‍රකාර ජාතික රක්ෂණ භාර අරමුදලට සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරය යටතේ ගිනි රක්ෂණ ඔප්පු, නාවික රක්ෂණ ඔප්පු, කම්කරු වන්දි රක්ෂණ ඔප්පු සහ වෙනත් විවිධ රක්ෂණ ක්‍රමයන් පිරිනැමීමට බලය පවරා තිබේ.

### Viii වගා රක්ෂණ යෝජනා ක්‍රමය

කෙතට අරුණ පොහොර දිරිය වැඩ සටහන යටතේ පොහොර සහනාධාර ලද ගොවිමහතුන් වෙනුවෙන් 2012 අයවැය යෝජනා අනුව 2013 වසරේදී වගා රක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත ලදී.නියඟ, වන අලි තර්ජන හා ගංවතුර වැනි ගැටළු හේතුවෙන් වගාවනට වන හානි අවම කිරීමේ විසඳුම් පියවරක් ලෙස මෙය අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමයක් සේ ක්‍රියාත්මක වන අතර මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යංශයේ අංක BD/EE/118/01/BP/2013, හා 2013.06.21 දිනැති චක්‍රලේඛය අනුව මෙහෙයවනු ලබයි.

# අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය



රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 12/2005 අනුව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව මගින් අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී. එය 2006 ජනවාරි 01 දින සිට ජාතික රක්ෂණ භාර අරමුදලේ විෂය පථය යටතට ගන්නා ලදී. විවාහක සේවක සාමාජිකයන්, ඔවුන්ගේ කලත්‍රයා හා දරුවන්(දරුවන් අවිවාහක, රැකියා විරහිත හා වයස අවුරුදු 21 ට අඩු නම් පමණක්) හා අවිවාහක සේවකයන් වන කල සාමජික, දෙමව්පිය,(දෙමව්පියන්ගේ වයස අවුරුදු 70 අඩුනම් පමණක්)යන අයට එමගින් ප්‍රතිලාභ සැලසේ.

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය හඳුන්වාදෙන ලද්දේ රාජ්‍ය සේවක, පලාත් රාජ්‍ය සේවක හා ඔවුන්ගේ පවුල් වල සාමාජිකයන් ගේ ජීවන තත්වය නගා සිටුවීමේ අදහස පෙරදැරිවය. ඒ අනුව කළමණාකරණය ඉදිරිපත් වන හිමිකම් ඉල්ලීම් සම්බන්ධයෙන් කටයුතු වේගවත් කිරීම සඳහා හැකි තරම් ඉක්මනින් පියවර ගනියි.

හිමිකම් ඉල්ලීම් සඳහා වන ගෙවීම් ක්‍රියාවලිය වේගවත් කරනු පිණිස ඊ- කාඩ් පත් ක්‍රමය හඳුන්වා දීමෙන් පසු ජාතික රක්ෂණ භාර අරමුදල හිමිකම් සඳහා වන නව ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර ඇත. සියළු අවශ්‍යතා සම්පූර්ණ කර ඉදිරිපත් කරනු ලබන හිමිකම් ඉල්ලීම් සඳහා ඊ- කාඩ්පත් ක්‍රමය හඳුන්වා දීමෙන් පසුව වැඩ කරන දින තුනක් ඇතුළත ගෙවීම් සිදු කර තිබේ.

2013 වසරේ සිට රාජ්‍ය සේවකයන්ගේ මාසික වැටුපෙන් සුදුසුකම් ඇති රාජ්‍ය සේවකයන් වෙනුවෙන් රුපියල් 125 ක් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාර අය කරනු ලැබේ. මේ රක්ෂණ ක්‍රමය යටතේ පහත ප්‍රතිලාභ කාණ්ඩයන් පිරිනමා තිබේ.

රෝහල් ගාස්තු වෙනුවෙන් වෛද්‍ය ප්‍රතිලාභ:

1.රෝහල් හා සාත්තු නිවාස ගාස්තු, වෛද්‍ය සහ ශල්‍ය වියදම්, වෛද්‍ය උපදේශන සේවා හෝ විශේෂඥ වෛද්‍ය සේවා සහ විශේෂඥ සේවා සහ විශේෂ සේවා, ගෘහ ප්‍රතිකාර යනාදිය වෙනුවෙන් ප්‍රතිලාභ මේ යටතේ සැපයේ.

2.උපැස් මිලට ගැනීම:

මේ ක්‍රමය යටතේ සාමාජිකයන් හට සෑම වසර තුනකට වරක් උපැස් යුවලක් මිලට ගැනීම පිණිස වන වියදම් සපුරා ගැනීම පිණිස රුපියල් 3500 ක හිමිකම් ඉල්ලා සිටිය හැක.

3.හෘද ශල්‍යකර්ම සඳහා වියදම් (හෘද රෝග):

මේ යෝජනා ක්‍රමය යටතේ සාමාජිකයන්ට හෘද සැත්කමක වියදම් පියවා ගැනීම පිණිස රුපියල් 400,000 ක හිමිකම් ඉල්ලා සිටිය හැක.

4. හදිසි අනතුරු මරණ සහ සාමාන්‍ය මරණ සඳහා රක්ෂණාවරණය

මේ යෝජනා ක්‍රමය යටතේ සාමාජිකයන්ට හදිසි අනතුරු මරණ සහ සාමාන්‍ය මරණ සඳහා රක්ෂණාවරන යටතේ රු. 600,000 සහ රු.100,000 ක හිමිකම් ඉල්ලා සිටිය හැක.

5."ණය සුරැකුම්" ණය වෙනුවෙන් වගකියන යෝජනා ක්‍රමය:

මාසික වැටුප මෙන් දස ගුණයක වටිනා කමකින් යුත් ණය සුරැකුමක් පිරිනැමෙන අතර රෝගී තත්වයක්, පූර්ණ හෝ අර්ධ ආබාධිත තත්වයක් යටතේ ණයගැතියාට සිය දිවිය හෝ සාමාන්‍ය . ඉපැයුම් මග අහිමිවෙයි නම් ණය මුදලේ ගෙවීමට ඉතිරිව ඇති කොටස මේ යටතේ ගෙවනු ලැබේ

## වගුව- 5.01 භෞතික කාර්ය සාධනය – 2013

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ හිමිකම් ඉල්ලීම් පිළිබඳ වර්ගීකරණය 2013 වසර (සංඛ්‍යා වශයෙන්)

| හිමිකම් ඉල්ලීම් වර්ගය | හිමිකම් ඉල්ලීම් මුළු ගණන (අසම්පර්ණතා සහිත හිමිකම්) | හිමිකම් ඉල්ලීම් සඳහා ගෙවීම් | හිමිකම් සඳහා ගෙවිය යුතු | ප්‍රතික්ෂේපිත හිමිකම් ඉල්ලීම් |
|---|---|---|---|---|
| මරණ | 2082 | 1978 | 59 | 45 |
| ආබාධිත තත්වයන් | 702 | 618 | 42 | 42 |
| දරු උපත් | 9460 | 8067 | 1117 | 276 |
| පිළිකා | 346 | 303 | 23 | 20 |
| හෘද රෝග | 504 | 493 | 09 | 02 |
| උපැස් | 60624 | 52831 | 2808 | 4985 |
| අනෙකුත් රෝග සඳහා රජයේ රෝහල් ගාස්තු | 30462 | 27162 | 2311 | 989 |
| අනෙකුත් රෝග සඳහා පෞද්ගලික රෝහල් ගාස්තු | 15354 | 12262 | 1426 | 1666 |
| වකුගඩු | 05 | 03 | - | 2 |
| අංශභාග | 07 | 04 | 01 | 02 |
| මුළු එකතුව | **119,546** | **103,721** | **7,796** | **8,029** |

වගුව- 5.02 ජාතික රක්ෂණ භාර අරමුදල

අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමයේ හිමිකම් ගෙවීම් (වාර්ෂික)

| හිමිකම් වර්ගය | වසර 2013 | වසර 2012 | වසර 2011 | වසර 2010 | වසර 2009 |
|---|---|---|---|---|---|
| අංශභාග | 19,500.00 | 85,045.00 | 811,842.00 | 346,734.00 | 396,208.00 |
| වකුගඩු රෝග | 170,255.00 | 442,069.00 | 2,174,098.00 | 3,924,953.00 | 396,208.00 |
| අනෙකුත් රෝගාබාධ වෙනුවෙන් අනෙකුත් පුද්ගලික රෝහල් වලට ගෙවීම් | 450,004,691.00 | 519,433,054.00 | 465,241,819.00 | 395,382,317.00 | 325,327,942.00 |
| අනෙකුත් රෝගාබාධ වෙනුවෙන් අනෙකුත් රජයේරෝහල් වලට ගෙවීම් | 130,537,351.00 | 135,187,766.00 | 130,001,995.00 | 124,605,768.00 | 118,388,616.00 |
| උපැස් | 179,283,805.00 | 188,253,705.00 | 178,824,095.00 | 177,584,405.00 | 171,046,450.00 |
| හෘද රෝග | 138,154,231.00 | 133,772,302.00 | 139,890,847.00 | 121,975,896.00 | 160,377,390.00 |
| පිළිකා | 6,971,447.00 | 9,809,079.00 | 13,432,312.00 | 25,034,123.00 | 18,743,792.00 |
| දරු උපත් | 33,731,317.00 | 70,449,064.00 | 103,922,760.00 | 91,679,848.00 | 83,787,896.00 |
| ආබාධිත | 18,046,862.00 | 19,904,080.00 | 19,588,568.00 | 29,358,660.00 | 33,806,187.00 |
| මරණ | 125,596,611.00 | 119,401,850.00 | 141,684,995.00 | 175,937,244.00 | 214,492,626.00 |
| මුළු එකතුව | **1,082,516,070.00** | **1,196,843,195.00** | **1,198,363,331.00** | **1,145,706,581.00** | **1,089,933,966.00** |

# වැඩවර්ජන, කැරලි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල



මෙම අරමුලේ සාමාජිකයන් වනුයේ ශ්‍රී ලංකාවේ බලපත්‍රලත් රක්ෂණ ආයතනයසියල්ලයි අරමුදලේ සියළු එම රක්ෂණ ආයතන මගින් නිකුත් කරනු ලබන මූලික ඔප්පුව යටතේ වැඩවර්ජන කැරලි කෝලාහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් දේපල වලට සිදුවන හාණි /පාඩු සඳහා හා/ හෝ පුද්ගල මරණ හෝ තුවාල ආවරණ කරා ව්‍යාප්ත කිරීම පිණිස පිහිවන ලදි 1987 වසරේ දී අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලැබූ තීරණයක් අනුව වැඩවර්ජන කැරලි කෝලාහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදය සඳහා වූ අරමුදල යනුවෙන් අරමුදලක් පිහිටුවනු ලදුව එය ජාතික රක්ෂණ සංස්ථාව විසින් පරිපාලනය කරන ලදී.

අනතුරුව වැඩවර්ජන කැරලි කෝලාහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදය සඳහා වූ අරමුදල මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය යටතට ගනු ලදුව 2005 වසරේ සිට මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශය විසින් කළමණාකරනය කරන ලදී.

2007 වසරේදී 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පණත යටතේ වැඩවර්ජන කැරලි කෝලාහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදි ක්‍රියා සඳහා වූ අරමුදල මුළුමනින්ම ජාතික රක්ෂණ භාර අරමුදල යටතට ගන්නා ලදී.

එසේ වැඩවර්ජන කැරලි කෝලාහල සහ සිවිල් අරගල සහ ත්‍රස්තවාදි ක්‍රියා සඳහා වූ අරමුදල අන්තර්ග්‍රහණය කිරිමෙන් පසු එකී පනතේ 18 වන වගන්තිය (1) උපවගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව අරමුදලට බැරකරන ලද සියලු මුදල් ජාතික රක්ෂණභාර අරමුදල විසින් පවත්වාගෙන යනු ලබන විශේෂ ගිණුමකට මාරුකරනු ලැබ ඇත.

එම ගිණුම පරිපාලනය කිරීම හා කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් වන මාර්ගෝපදේශ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් වරින් වර නිකුත් කරනු ඇත.

නව මාර්ගෝපදේශ නිකුත් කරන තුරු වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල ජාතික රක්ෂණ භාර අරමුදලට අන්තර්ග්‍රහනය කිරීමට පෙර ගනු ලැබූ ක්‍රියා මාර්ග අඛණ්ඩව අනුගමනය කරන ලදි..

## වැඩවර්ජන,කැරලිකෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලේ ප්‍රධාන කාර්යයන්

- රක්ෂණ සමාගම් හරහා වාරිකය මුදල් අය කරගෙන අරමුදලට ප්‍රේෂණය කිරීම හා ඉහල අනුපාත මත ආදායම් උත්පාදනය පිණිස ආයෝජනය කිරීම
- ජාතික රක්ෂණ භාර අරමුදලේ අනුමැතිය මත රක්ෂණ සමාගම් මගින් ඉල්ලුම් කරන හිමිකම්පෑම් සඳහා වැඩ වර්ජන, කළ කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාද අරමුදලෙන් ප්‍රතිපූර්ණය කිරීම
- ත්‍රස්තවාදී ප්‍රහාර හේතුවෙන් හානියට පත් ආයතන වලට ප්‍රදානය කරන ලද මෘදු ණය කළමනාකරණය කිරීම. මෙම ක්ෂය මුදල් පරිපාලනය කරනුයේ ලංකා බැංකුව විසිනි.

## වැඩවර්ජන, කැරලිකෝලාහල සිවිල් අරගල සහ ත්‍රස්තවාද අරමුදලේ ප්‍රධාන අරමුණු

- වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද ක්‍රියා හේතුවෙන් වන හානි ආවරණය කිරීම සඳහා සියළු සාමාජිකයන් ගෙන් අයකරනු ලබන වාරික මුදල් කොටස රක්ෂණ සමාගම් වෙතින් ගෙන්වා ගෙන අරමුදල ස්ථාපිත කිරීම

- ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ භූගෝලීය සීමාව තුළ සාමාන්‍ය රක්ෂණ අවදානම් යටතේ රක්ෂණය කර ඇත්තා වූද, වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද ක්‍රියා හේතුවෙන්දේපලවලට වන හානි/පාඩු හෝ පුද්ගලයනට වන තුවාල වෙනුවෙන් රක්ෂණ ඔප්පු මගින් නිර්වචනය කර ඇති පරිදි ආරක්ෂාව සහතික කිරීම

- අපේම වූ ශ්‍රී ලංකා අරමුදලක් මගින් ආවරණ සහතික කිරීම මගින් වාරික ආදායම් ලෙස විදෙස් වලට ඇදී යනවිශාල මුදලක් ඉතිරි කර ගැනීම.

## වැඩවර්ජන, කැරළි කලකෝලාහල සිවිල් අරගල සහ ත්‍රස්තවාදි අරමුදලේ මූල්‍ය සමාලෝචනය

2013 වසර අවසන් වූයේ වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදල් පිළිබඳ අංශයට වැදගත් වසරක් වෙමිනි. ඒ වසර තුළ 2012ට සාපේක්ෂව රුපියල් මිලියන 262 කින් දළ වාරික ආදායම ඉහල ගොස් ඇති අතර ආයෝජන ආදායම රුපියල් මිලියන 13.9 කින් වර්ධනය වුණි.. වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාදී අරමුදලේ 2013.12.31 දිනට මුළු ආයෝජන ප්‍රමාණය රුපියල් බිලියන 5.1 ක් වූ සේම 2013වසරේ ඒකාබද්ධ අරමුදලට බැර කරන ලද ප්‍රමාණය රුපියල් බිලියන 2.4 කි. 2012 වසරේ වාර්තා වූ රුපියල් මිලියන 37 සමග සාපේක්ෂව බලන විට 2013 වසරේ හිමිකම් ඉල්ලීම් ශුද්ධ වටිනාකම රුපියල් මිලියන 2.7 දක්වා පහල බැස තිබේ. එසේම 2012 වසරට සාපේක්ෂව තත් වසරේ පරිපාලන හා මෙහෙයුම් වියදම්ද පහල බැස තිබේ.

# ප්‍රතිරක්ෂණය



2008 වසරේ සාමාන්‍ය රක්ෂණ ව්‍යාපාරික කටයුතු වල නියැලෙන එක් එක් රක්ෂණ සමාගමක් විසින් සාමාන්‍ය රක්ෂණ කටයුතු වලින් පැන නගිනු ලබන ප්‍රතිරක්ෂණ කොටස් වලින් 20% ක ප්‍රතිශතයක් අනිවාර්යයෙන් ලබා ගැනීම පිණිස අංක 1528/20 හා 2007 දෙසැම්බර් 19 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාර හා 2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පණත යටතේ ප්‍රතිරක්ෂණ දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී.අනතුරුව 2012 දෙසැම්බර් 31 දිනැති අංක 1791/4 දරණ සංශෝධිත ගැසට් නිවේදනය ප්‍රකාර මේ වසරේදී මෙකී අනිවාර්ය ප්‍රතිශතය 20% සිට 30% දක්වා ඉහල නංවන ලදී.

මෙකී දෙපාර්තමේන්තුව ස්ථාපිත කිරීමේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාවෙන් බැහැරට ඇදී යන විදෙස් විනිමය රඳවා ගැනීමයි. තවද මෙම ආයතනය ශ්‍රී ලංකාවේ "ජාතික ප්‍රතිරක්ෂකයා" ලෙස ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

සැම සාමාන්‍ය රක්ෂණ ආයතනයක්ම සිය ප්‍රතිරක්ෂණ වටිනාකමින් 30%ක් අනිවාර්යයෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදලට ලබාදිය යුතු අතර ඒ අනුව පිලිගත් වගකීමට සමාන වටිනාකමක් මත එවන් කවර රක්ෂණ සමාගමක් වුව ඉදිරිපත් කරනා හිමිකම් පියවීමට ජාතික රක්ෂණ භාර අරමුදල බැඳී සිටියි.

මේ වසර තුළ ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රධාන රක්ෂණ සමාගම් 17 කින් ප්‍රතිරක්ෂන ගිවිසුම් 103 ක් පිලිගෙන ඇති අතර වාරික වශයෙන් රුපියල් මිලියන1042ක් රැස්කර තිබේ. රක්ෂණ ක්ෂේත්‍රයේ වෘත්තිකයන්ගෙන් සැදුම් ලත් ප්‍රතිරක්ෂණ හිමිකම් ගෙවීම් මණ්ඩලයේ අනුමැතිය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල රුපියල් මිලියන 20 ක් හිමිකම් ගෙවීම් ලෙස සෘජුවම රක්ෂන ආයතන වෙත ලබා දී ඇත.

ජාතික රක්ෂණ භාර අරමුදල සමග ගණුදෙනු කළ සමාගම් පහත පරිදි වේ.

1. සී.ස එලයන්ස් රක්ෂණ සමාගම
2. අමානා ටකාෆුල් රක්ෂණ සමාගම පී.එල්.සී
3. ඒෂියන් එලයන්ස් පී.එල්.ස
4. ඒ. අයි.ඒ ඉන්ෂුවරන්ස් පී.එල්.සී
5. සෙලින්කෝ ඉන්ෂුවරන්ස් පී.එල්.සී

6. සී.ස ඒ.අයි.ජී ඉන්ෂුවරන්ස් සමාගම
7. සී.ස කොන්ටිනෙන්ටල් ඉන්ෂුවරන්ස් ලංකා සමාගම
8. සී.ස. සමූපකාර රක්ෂණ සමාගම
9. එච්.එන්.බී ඇෂුවරන්ස් පී.එල්.සී
10. ජනශක්ති ඉන්ෂුවරන්ස් පී.එල්.සී
11. සී.ස එල්.ඕ.එල්.සී. රක්ෂණ සමාගම
12. සී.ස එම් බී එස් එල් රක්ෂණ සමාගම
13. සී.ස ඔරියන්ට් ඉන්ෂුවරන්ස් සමාගම
14. සී.ස පීපල්ස් ඉන්ෂුවරන්ස් සමාගම
15. සී.ස සණස රක්ෂණ සමාගම
16. සී.ස ශ්‍රී ලංකා රක්ෂණ සමාගම
17. යූනියන් ඇෂුවරන්ස් පී එල් සී

# මෝටර් වාහන රක්ෂණය



ජාතික රක්ෂණ භාර අරමුදල පිහිටුවාලීමෙන් අනතුරුව රාජ්‍ය ආයතනයන්ට අයත් වාහන (වෛකල්පිත) සහ අර්ධ රාජ්‍ය ආයතනවලට අයත් වාහන) (වෛකල්පිත) රක්ෂණය කිරීම උදෙසා 2009 අංක B/F 437 දරණ චක්‍රලේඛය ප්‍රකාරව මෝටර් වාහන රක්ෂණ ක්‍රමය හඳුන්වා දෙන ලදි. පෞද්ගලික කාර් රක්ෂණ ඔප්පු (පෞද්ගලික කාර්, ස්ටේෂන් වැගන් රථ, ජීප් රථ, ත්‍රීවීලර් යනාදිය) වාණිජමය වාහන රක්ෂණ ඔප්පු (භාණ්ඩ ප්‍රවාහන වාහන, ගාස්තුවකට හෝ ප්‍රදානයකට මගීන් රැගෙන යාමේදී භාවිතා කරනු ලබන ද්විත්ව කාර්ය වාහන, බස් (කුලියට හෝ පෞද්ගලික), කෘෂිකාර්මික වාහන යනාදිය), යතුරු පැදි රක්ෂණ ඔප්පු (යතුරු පැදි, ස්කූටර්, මොපෙඩ් යතුරු පැදිය යනාදිය සඳහා)වැනි විවිධ වාහන කාණ්ඩ සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල විසින් විවිධාකාර මෝටර් වාහන රක්ෂණ ඔප්පු පිරිනමයි.

**වගුව- 5.03 ගෙවන ලද මෝටර් රථ රක්ෂණ හිමිකම් වර්ගීකරණය**

| වාහන පංතිය | 2012 | | 2013 | |
|---|---|---|---|---|
| | එකතුව | | එකතුව | |
| | හිමිකම් සංඛ්‍යාව | හිමිකම් මුදල (රුපියල් මිලියන)-2012 | හිමිකම් සංඛ්‍යාව | හිමිකම් මුදල (රුපියල් මිලියන)-2013 |
| ට්‍රැක්ටර් | 6 | 0.00 | 2 | 0.06 |
| පුද්ගලික මෝටර් රථ | 685 | 45.99 | 497 | 43.05 |
| යතුරු පැදි | 65 | 0.66 | 37 | 0.54 |
| මෝටර් කෝච් | 142 | 6.58 | 101 | 8.13 |
| ලෝරි රථ/ ඉඩම් වාහන | 104 | 3.90 | 78 | 3.20 |
| ද්විත්ව කාර්යය වාහන | 531 | 30.95 | 372 | 23.98 |
| ට්‍රේලර් | 1 | 0.02 | 1 | 0.01 |
| එකතුව | 1,534 | 88.11 | 1088 | 78.97 |

# සාමාන්‍ය රක්ෂණය



ජාතික රක්ෂණ භාර අරමුදල පොදු රක්ෂණ කටයුතු ගිනි රක්ෂණය, මුහුදු උවදුරු රක්ෂණය විවිධ රක්ෂණ යෝජනා ක්‍රමය, සේවක වන්දි රක්ෂණය සහ වෛද්‍ය රක්ෂණය වශයෙන් ප්‍රධාන උප අංශවලට බෙදනු ලැබේ. 2009.08.20 වැනි දින නිකුත් කෙරුණු අංක 1615/20 දරණ ගැසට් නිවේදනය ප්‍රකාර මෙම රක්ෂණ යෝජනා ක්‍රමය ජාතික රක්ෂණ භාර අරමුදල යටතේ පිහිටුවන ලද අතර එය පසුගිය වර්ෂ කීපය තුළ නොවෙනස්ව වර්ධනය වී ඇත.

සාමාන්‍ය රක්ෂණය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ගිනි රක්ෂණ ඔප්පු, මුහුදු උවදුරු රක්ෂණ ඔප්පු, සේවක වන්දි රක්ෂණ ඔප්පු පිරිනමනු ලැබේ.

**වගුව- 5.04** සාමාන්‍ය රක්ෂණ අංශය විසින් නිකුත් කර ඇති රක්ෂණ ඔප්පු විශ්ලේෂණය

| ඔප්පු වර්ගය | ඔප්පුගණන |
|---|---|
| ගිනි උවදුරු රක්ෂණය | 03 |
| මුහුදු නැව් භාණ්ඩ රක්ෂණය | 110 |
| පුද්ගලික හදිසි අනතුරු රක්ෂණය | 03 |
| කම්කරු වන්දි රක්ෂණය | 02 |
| සොර බිය රක්ෂණය | 03 |
| මාර්ගස්ථ මුදල් රක්ෂණය | 04 |
| විද්‍යුත් උපකරණ රක්ෂණය | 07 |
| කොන්ත්‍රාත්කරුවන්ගේ සියළු වගකීම් රක්ෂණය | 17 |
| යන්ත්‍රෝපකරණ රක්ෂණය | 00 |
| සෞඛ්‍යය රක්ෂණය | 15 |
| විදේශ සංචාර රක්ෂණය | 9 |
| එකතුව | 173 |

# වගා රක්ෂණය



කෙතට අරුණ පොහොර දිරිය වැඩ සටහන යටතේ පොහොර සහනාධාර ලද ගොවි ගොවි මහතුන වෙනුවෙන් 2012 අයවැය යෝජනා අනුව 2013 වසරේදී වගා රක්ෂණ යෝජනා ක්‍රමය ස්ථාපිත කරන ලදී.නියඟ, වන අලි තර්ජන හා ගංවතුර වැනි ගැටළු හේතුවෙන් වගාවනට වන හානි අවම කිරීමේ විසඳුම් පියවරක් ලෙස මෙය අනිවාර්ය රක්ෂණ යෝජනා ක්‍රමයක් සේ ක්‍රියාත්මක වන අතර මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ අංක BD/EE/118/01/BP/2013, හා 2013.06.21 දිනැති චක්‍රලේඛය අනුව මෙහෙයවනු ලබයි.

සෑම වගා කන්නයකදීම තමන් ලබා ගන්නා කිලෝ ග්‍රෑම් 50 රසායනික පොහොර බෑගයක් සඳහාම ගොවීහු (කි.ග්‍රෑ. 1 සඳහා රු. 3 බැගින් වන සේ) රුපියල් 150 ක දායකත්වයක් සපයති. මෙසේ රක්ෂණ වාරිකය අය කරනු ලබන්නේ පොහොර සහන අලෙවි කරනා ආයතන වන ගොවිජන සේවා මධ්‍යස්ථානය හා සමූපකාර සමිති මගිනි. ඒ රසායනික පොහොර මිලට ගන්නා අවස්ථාවේදීය.

ඊට අමතරව සියළු බලපත්‍ර ලත් බැංකු, ලියාපදිංචි වී ඇති රක්ෂණ සමාගම් හා මූල්‍ය සමාගම් වෙතින්ද වාර්ෂක ලාභයෙන් වගා රක්ෂණ බද්දක් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අය කරනු ලබයි.

සම්පූර්ණ වගා හානි වීමකදී හෙක්ටෙයාරයකට උපරිමය රුපියල් 25000ක් වන මුදලකට යටත්ව (අක්කරයකට රු. 10,000 බැගින්) රක්ෂණ ප්‍රතිලාභ ගෙවනු ලබයි. වගා පියවර මත පිහිටා වගා හානි තක්සේරු කමිටුව හානිය තක්සේරු කල යුතුය. ජාතික රක්ෂණ භාර අරමුදලට ගොවිජන සංවර්ධන මධ්‍යස්ථාන වෙතින් නිර්දේශිත හිමිකම් ඉල්ලීම් ලද පසුව හිමිකම් ගෙවීම් ක්‍රියාවලිය අරඹා ගොවි මහතුන්ගේ බැංකු ගිණුම් වලට අදාල ගෙවීම් සෘජුවම බැර කරනු ලැබීය.



# 6. තිරසාර වාර්තාකරණය

ජනතාව හා සමාගම් විවිධ නම් වලින් තිරසරභාවයට සම්බන්ධ වෙති- එනම් සංයුක්ත පුරවැසිභාවය, සමාජ වගකීම, දේශගුණ විපර්යාස සම්බන්ධ මූලාරම්භයන්, හෝ හරිත ව්‍යාපාරය යනාදී වශයෙන්.

හරයාත්මක වශයෙන් ගත් කළ ස්වාභාවික සම්පත් හා බල ශක්තීන් හි භාවිතය අඩු කිරීම පිණිස සමාගම් ව්‍යාපාරික ක්‍රියාවලිය නවීකරණය කිරීම, හරිත වායු විමෝචන දත්ත ලබා ගැනීම, මිණුම්කරනය, හා වාර්තාකරණය, සම්බන්ධයෙන් වන පරිසර අවබෝධය හා දේශීය ප්‍රජා ගැටළුවලට මැදිහත්වීම ඇතුළු කවරක් වුව තිරසරකරණය වශයෙන් ගත හැක.

පාර්ශවකරුවන්(ආයෝජකයන්, සේවකයන්, පාරිභෝගිකයකන්, සැපයුම්කරුවන්, හා ප්‍රජාව) සහ ප්‍රාග්ධන වෙළඳ පල වඩා දියුණු, පාරදෘෂ්‍ය සන්නිවේදනයක් මූල්‍ය නොවන තිරසර දත්ත සම්බන්ධයෙන් වඩ වඩා ඉල්ලා සිටිති. සංවිධානයන්හී ආර්ථික, පරිසර, හා සමාජ බලපෑම් පිළිබඳ තොරතුරු සන්නිවේදනය කරනා, සංයුක්ත සමාජ වගකීම, පරිසරාත්මක සමාජ පාලනය, හෝ ත්‍රෛයි පත්ල සීමා මායිම් වාර්තා යනුවෙන්ද හැඳින්වෙන තිරසරකරණ වාර්තා මූල්‍ය වාර්තා හා සම්බන්ධව වඩ වඩා නිකුත් කෙරෙන අතර සමාගමක දිගුකාලීන පැවැත්ම ඇගයීමේදී පාර්ශවකරුවන්ද ඒවා නිතර භාවිතා කරති.

සමාගම් තම මූලික ව්‍යාපාරික උපායමාර්ගයන්ට තිරසරකරණය බද්ධ කර ගන්නා විට කාලීන හා නිවැරදි තිරකරකරණය හා ආශ්‍රිත න්‍යාසයන්හි වැදගත්කම ඉහල යයි. එහිදී ඒවා මූල්‍ය දත්ත වලට වඩා ඉහලින් ඇති හෙයින් ජොෂ්ඨ කළමණාකරනයට මේ න්‍යාසයන් පිළිබඳ ඒ මට්ටමේම පාලනයක් අවශ්‍ය වන සේම ඔවුහු එය අපේක්ෂා කරති. එතෙකුදු වුවත් බොහෝ අවස්ථාවල එවැන්නක් දක්නට නොලැබේ. අභ්‍යන්තර හෝ බාහිර භාවිතය වේවා, සංවිධාන ක්‍රියාවලිය, පාලනයන්, හා දත්ත පිලිබඳ ස්වාධීන සහතිකය සමාගමේ තිරසරකරණ දත්ත විශ්වාසී හා නිරවද්‍ය අයුරින් පවතින බවට සහතික වෙයි. එමගින් තීරණ ගැනීමේදි භාවිතා කරන තොරතුරු වල විශ්වාසී බව , වන්දි හා බාහිර වාර්තාකරණය යනාදියට උපකාර සැලසේ.

<u>පාර්ශවකරුවන් කණ්ඩායම 1 - රජය</u>

ජාතික රක්ෂණ භාර අරමුදල විසින් 2012 වසරේදී එතෙක් ලබා දුන් ඉහලම දායකත්වය සනිටුහන් කරමින් රු.බිලියන. 4.2 ක් වාර්ෂික දායකත්වය ලෙස ඒකාබද්ධ අරමුදලට ලබා දී ඇත. 2013 වසරේදීද රු.බිලියන. 3.2 ක වාර්ෂික දායකත්වයක් සපයා ඇත. 2008, 2009 සහ 2010 වර්ෂවල මෙම අරමුදලට ජාතික රක්ෂණ භාර අරමුදල විසින් සපයන ලද මූල්‍ය දායකත්වය පිළිවෙලින් රු.බිලියන 1 රු. බිලියන 2.25 සහ රු. බිලියන 2 ක් වේ.

වගුව – 6.01: ඒකාබද්ධ අරමුදලට දායකවීම

| මුදල් වර්ෂය | රු මිලියන |
|---|---|
| 2006 | 4,000 |
| 2007 | - |
| 2008 | 1,000 |
| 2009 | 2,250 |
| 2010 | 2,000 |
| 2011 | 3,495 |
| 2012 | 4,200 |
| 2013 | 3,200 |

පාර්ශවකරුවන් කණ්ඩායම **2** - පාරිභෝගිකයන්

විදේශ රැකියා රක්ෂණ යෝජනා ක්‍රමය යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල 2012 මුල් මාසයන්හිදී මැද පෙරදිග රටවල සේවයේ නියුතු ශ්‍රී ලාංකික ගෘහ සේවිකාවන් උදෙසා රක්ෂණාවරනයක් සැපයීය. 2012 මුල් මාසවලින් පසු ජාතික රක්ෂණ භාර අරමුදල රක්ෂණ ඔප්පු පිරිනැමීම නතර කළද විවිධ අනතුරු හා ව්‍යසනයන්ට පත් විදෙස් රැකියාවන්හි නියුතු විගමනික ශ්‍රී ලාංකිකයන් හටද විදෙස් රැකියාශ්‍රිත රක්ෂණ හිමිකම් ගෙවීමේ නිරත විය.

2013 වසර තුළ සහන පදනමක් මත අග්‍රහාර රක්ෂණ යොජනා ක්‍රමය පවත්වාගෙන ගිය ජාතික රක්ෂණ භාර අරමුදල රජයේ සේවකයන් හට විශාල වශයෙන් හිමිකම් ගෙවීමට කටයුතු කළේය.

පාර්ශවකාර කණ්ඩායම **3 –** සමාජය

2013 වසරේ දැයට කිරුළ ප්‍රදර්ශණය පැවති අවස්ථාවේ දී ජාතික රක්ෂණ භාර අරමුදල එම ප්‍රද්ර්ශණයේ කටයුතු කළ අය සඳහා පුද්ගල හදිසි අනතුරු රක්ෂනාවරන සැපයීමට කටයුතු කළේය.

පාර්ශවකාර කණ්ඩායම **4 –** සේවකයන්

මානව සම්පත් හා පරිපාලන අංශය කලමණාකරනයේ අවශ්‍යතා සපුරාලනු වස් ජාතික රක්ෂණ භාර අරමුදලේ කාර්ය මණ්ඩල, පහසුකම් සම්පාදනය, යටිතල පහසුකම් යන ක්ෂේත්‍ර සවිමත් කිරීමට හා අවශ්‍ය සම්බන්ධීකාරක සහය සැපයීමට කටයුතු කරයි. මෙහිදී භෞතික යටිතල පහසුකම් හා කාර්යාලයේ මානව සම්පත් සඵලදායී ලෙස උපයෝජනය කිරීම සදහ විශේෂ අවධාණයක් යොමු කෙරේ.

එසේම අපි 2013 වසරේදීද සංවිධාන අරමුණු සාධනය පිණිස උපරිම අයුරින් කටයුතු කළෙමු.

සේවකයන් යනු අප සංවිධානයේ ප්‍රධාන පාර්ශවයකි. ජාතික රක්ෂණ භාර අරමුදලේ සාර්ථකත්වය රඳා පවතින්නේ අප සේවකයන් ගේ කාර්ය සාධනය මතය. දුර්වල කාර්ය සාධනය යනු ජාතික රක්ෂණ භාර අරමුදලට හානිකර වන්නකි. ශ්‍රම බලකාය සම්බන්ධයෙන් කළමණාකරනය හා මාර්ගෝපදේශයන් උදෙසා සාර්ථක ප්‍රවේශයක් නිර්මාණය කිරීමට මානව සම්පත් අංශයේ දෘඪතර සහය මෙන්ම විශේෂඥ දැනුම හා සාර්ථක නායකත්වයක ප්‍රායෝගිකත්වය අවශ්‍ය වේ. තරඟකාරි මට්ටම් වලදී වෙළඳපල තුළ සාර්ථකත්වය අත්කර ගැනීම පිණිස උගත් කාර්ය මණ්ඩලයක විභවයේ වැදගත්කම අපි හඳුනා සිටිමු. එහෙයින් අපි පුහුණු, සංවර්ධන හා සුභසාධන වැඩ සටහන් හරහා කාර්ය මණ්ඩලය වෙනුවෙන් ආයෝජනය කළෙමු

2010-2013 කාලය තුළ සේවක සුභ සාධනය වෙනුවෙන් වැය කළ මුදල(රු,)

| | 2010 | 2011 | 2012 | 2013 |
|---|---|---|---|---|
| | 935,912 | 1,438,399 | 1,944,808 | 957,411 |

ශ්‍රම බලකායේ සමගිය හා කණ්ඩායම් හැඟීම වර්ධනය කරනු වස් 2013 වසරේ වාර්ෂික බක් මහ උළෙල පැලවත්ත බුද්ධදාස ක්‍රීඩාංගනයේ පවත්වන ලදී.

.



තවද පුරුදු පරිදි ජනවාරි 01 දින අප කටයුතු ආරම්භ කළේ අප මෙන්ම අප සංවිධානයටද සෙත් පතා බෞද්ධ ස්වාමීන්වහන්සේ නමක විසින් පවත්වන ලද ධර්ම දේශණයකට සවන් දීමෙනි. 2013 වසරේ අපි රන්ටැඹේ හි නේවාසික පුහුණු වැඩ සටහනක් සංවිධානය කළෙමු. එය දින තුනක බාහිර වැඩ සටහනක් වූ අතර ඒ තුළින් කාර්ය මණ්ඩලයට කණ්ඩායම් හැඟීම මෙන්ම ආකල්ප සංවර්ධනය ගැන බොහෝ කරුණු ඉගෙන ගැනීමට ලැබිණි.





# 7. පාලන වාර්තාකරණය

## සංයුක්ත පාලනය

## හැඳින්වීම

ව්‍යාපාර පාලනය සංස්ථාපිත පාලනයේ මිනුම් දෙකකින් සමන්විත වන්නකි. එනම් අනුකූලතාව හා කාර්ය සාධනය යන ද්විත්වයෙන් සමන්විත වන්නකි. මින් අනුකූලතාව යන්නට පුළුල් ව්‍යුහයන් හා කාර්යභාරයන්, විධායක පාරිශ්‍රමිකයන් ඇතුලත් වේ. සහතික කිරීම හා විගණනය ට යටත්ව මේ කලාපය තුළ නීති රීති හා/හෝ මාර්ගෝපදේශයන් පොදුවේ උපකාරී කරගත හැක.. කාර්යසාධන පාලනය මේ අතර උපාය මාර්ග හා වටිනාකම් එකතුකිරීම හා කේන්ද්‍රගත වේ. අවදානම් හා කාර්යසාධනයේ ප්‍රධාන වාහකයන් කෙරේ වන අවධානය වටහා ගන්නා අතරම උපාය මාර්ගික තීරණ ගැනීම පිණිස මණ්ඩලයක් අවශ්‍ය වේ. මෙය කෙසේවත් ප්‍රමිති හා විගණනයයේ පාලනයක් හා පහසුවෙන් නොගැලපෙයි. එහෙයින් විවිධ සංවිධාන මාදිලීන් හි විචක්ෂණ ලෙස යොදා ගත හැකි විශිෂ්ට උපකරණ හා තාක්ෂණයන් සමූහයක් සංවර්ධනය කිරීම අවශ්‍ය වේ. එක්සත් ජනපදයේ එන්රෝන් , වර්ල්ඩ් කොම් සහ එක්සත් රාජධානියේ මාර්කෝනි යන ආයතන වල අසාර්ථකත්වයන් හමුවේ ව්‍යාපාර පාලනය යන්න කැපී පෙනෙන පරිචයක් බවට පත් විය. මේ ආයතනයන්හී බොහෝ කොටස් හිමි වටිනාකම් එහිදී අහිමි වී ගියේය. එසේම මෙකී අසාර්ථකත්වයන් හමුවේ බටහිර සංස්ථාපිත ලොව තුළ විශ්වාසය දියකර හැරි අතර අනාගතයේදී එවන් සිද්ධි මග හැරියහැක්කේ කෙසේද යන්න ගැන අවබෝධ කරගැනීමට දැඩි ප්‍රයත්නයක් දරන ලදී.

ජාතික රක්ෂණ භාර අරමුදලේ උපායමාර්ගික වැඩ පිලිවෙලේ ඉහලම මට්ටමේදී එය විනය, පාරදෘෂ්‍යභාවය,ස්වාධීනත්වය,වගවීම,සාධාරණත්වය හා සමාජ වගකීම වැනි ඉතා වැදගත් සංස්ථාපිත පාලන වටිනාකම් අදාල කරගන්නා අතරම මෙහෙයුම් සඵලදායීත්වය, කාර්යක්ෂමතාව හා ආර්ථික තත්වය පූර්ණ වශයෙන් වර්ධනය කරන්නාවූද, සන්නම් ප්‍රතිරූපය ප්‍රවර්ධනය කරන්නාවූද, මහජන විශ්වාසය පවත්වා ගන්නාවූද යහපත් පාලන පරිසරයක සාර්ථකත්වයට බලපානා තීරක සාධකය ලෙස ශක්තිමත් සංස්ථාපිත පාලනයක වැදගත්කම ඉහලින්ම හඳුනාගෙන සිටී.

2006 අංක 28 දරණ ජාතික රක්ෂණ භාර අරමුදල් පණත යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල ස්ථාපිත කරන ලද දින පටන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය මගින් නිකුත් කරන ලද විශිෂ්ට භාවිතාවක් පිණිස වන සංස්ථාපිත පාලන නීති මාලාවේ අදාල කොටස් හා යහ පාලන හා සංස්ථාපිත පාලන පරිචයන් උදෙසා වන රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශයන් වෙත නිසි අවධානය යොමු කරමින් එහි සංස්ථාපිත පාලන පරිචය පවත්වා ගන්නාලදී.

ජාතික රක්ෂණ භාර අරමුදලේ පාලන පරිචයන් මගින් පහත දෑ සහතික කෙරේ.

- ව්‍යාපාර කටයුතු නිවැරදි දිශානතියට යොමු කරන බව,
- අදාල ඒකකයන් හී කළමණාකරනය හා නායකත්වය දරණ මාණ්ඩලික නිලධාරීන් ඵලදායී හා වගවීමෙන් යුතු බව,
- ජාතික රක්ෂණ භාර අරමුදල නිසි පාලනයන් ඇති බව හා අවධානම් නිතිපතා අධීක්ෂණය හා කලමණාකරනය කෙරෙන බව සහ
- සියළු පාර්ශවකරුවන්ගේ සුභසිද්ධිය උදෙසා සේවකයන් නිවැරදි දෙය කරන බවත්ය.

### පරිපාලන අත් පොත

2013 වසර තුළ කළමණාකරන සේවා දෙපාර්තමේන්තුව හා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව මගින් නිකුත් කරන ලද චක්‍රලේඛයන්ට නිසි අවධානය යොමු කරමින් ජාතික රක්ෂණ භාර අරමුදලට පරිපාලන අත් පොතක් සැකසීමට මූලාරම්භයන් ගන්නා ලදී.

### ව්‍යාපාර චර්යා

ජාතික රක්ෂණ භාර අරමුදල මගින් එහි ජොෂ්ඨ කළමණාකාරීත්වය සඳහා ව්‍යාපාර චර්යා හා ආචාර ධර්ම සංග්‍රහයක් අදාල කර ගනී.
එමගින් ආවරණය කරනා කලාපයන් වන්නේ,

- බැඳියා පිලිගැටුම වැලැක්වීම
- ජාතික රක්ෂණ භාර අරමුදලේ ආරක්ෂාව සහ වත්කම් මනා භාවිතය
- නියාමකයන් හා විගණකයන් සමග මනා සන්නිවේදනය
- ආචාරධාර්මික ව්‍යාපාර ප්‍රමිතීන් හා ව්‍යාජ හැසිරීම් පාලනය
- අසමාන සැලකිලිවලින් තොරවීම

### මූල්‍ය සහ රක්ෂණ කටයුතු පිලිබඳ නිපුණත්වය

ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය සහ රක්ෂණ කටයුතු පිළි බඳ නිපුණත්වය 2013 වසර තුළ ද අධ්‍යක්ෂ මණ්ඩලය හා සභාපතිවරයා විසින් ශක්තිමත් කරන ලදී.

### ජාතික රක්ෂණ භාර අරමුදල් මණ්ඩලය

2006 රක්ෂණ භාර අරමුදල් මණ්ඩල පණත අනුව මුදල් අමාත්‍යාංශයේ නිලධාරියකු, මුදල් අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරී, සෞඛ්‍ය අමාත්‍යාංශය නියෝජනය කරන නිලධාරියකු, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය නියෝජනය කරන නිලධාරයකු, ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ අධ්‍යක්ෂ ජනරාල්, හා මූල්‍ය, රක්ෂණ, බැංකු, කළමණාකරණ හා නීති යන අංශ වල විශේෂඥයන් නියෝජනය කරනු පිණිස අමාත්‍යවරයා විසින් නම් කරනු ලබන තවත් තිදෙනකුගෙන් සමන්විත මුළු ගණනින් අටදෙනකුවන අධ්‍යක්ෂ මණ්ඩලයකින් ජාතික රක්ෂණ භාර අරමුදලේ පරිපාලනය හා කළමණාකරනය සිදුකෙරේ. එක් පුද්ගලයකු මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත් කිරීමේ බලය අමාත්‍යවරයා සතුවේ. පණත අනුව මණ්ඩලයේ සැම සාමාජිකයකුම පත්වීම් දින සිට වසර පහක කාලයක් ධූර දැරිය යුත්තේය. අධ්‍යක්ෂ මණ්ඩලයේ නම් 11 පිටුවේ දැක්වේ.

### තොරතුරු සම්පාදනය

අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම්වලට පෙර අධ්‍යක්ෂකවරුන් හට කාලීන, නිවැරදි, අදාල හා විස්තීර්ණ තොරතුරු මාලාවක් සපයන බවට ජොෂ්ඨ කළමණාකරනය සහතික වේ. මෙකී විශ්ලේෂණයන් තුළ අදාල කාලය සඳහා වන මූල්‍ය මෙන්ම මූල්‍ය නොවන සියළු තොරතුරු ඇතුලත් වේ. මණ්ඩල

තීරණ ගැනීම උදෙසා සභාපතිවරයා හා අධ්‍යක්ෂ මණ්ඩලය මාසික පදනමින් රැස්වේ. 2013 වසර තුළදී අධ්‍යක්ෂ මණ්ඩලය මෙසේ රැස්වීම්වාර 15ක් පවත්වා තිබේ. එසේම විගණන කමිටුවද 2013 වසර තුළ රැස්වීම් වාර 9 ක් පවත්වා තිබේ..

## මූල්‍ය ප්‍රකාශ

ජාතික රක්ෂණ භාර අරමුදල ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති, අනෙකුත් අදාල නීති හා රෙගුලාසි මෙන්ම ශ්‍රී ලංකා රක්ෂණ මණ්ඩලයේ රෙගුලාසි අනුව සිය මූල්‍ය වාර්තා ඉදිරිපත් කරයි. විචක්ෂණ තීරණ ගැනීම උදෙසා පාර්ශවකරුවන්ට කාර්ය සාධනය හා අනාගත උපාය මාර්ගයන් පිලිබඳ විස්තරාත්මක හා පාරදෘෂ්‍ය විශ්ලේෂණයක් ඉදිරිපත් කරයි.

## වාර්ෂික වාර්තාව- 2013

සිය වගවීම් ක්‍රියාවලියේ මූලික අවශ්‍යතාවක් ලෙස සලකමින් ජාතික රක්ෂණ භාර අරමුදල 2013 වසරේ අරමුදලේ කටයුතු ගැන සමස්ත දර්ශණයක් සපයන සේ 2013 වාර්ෂික වාර්තාව සකසා තිබේ.

## ප්‍රසම්පාදනය

ජාතික රක්ෂණ භාර අරමුදල NPA **මාර්ගෝපදේශ අනුව** සිය ප්‍රසම්පාදන කටයුතු කරයි. සුළු පරිමාණ ප්‍රසම්පාදනයන්හිදී එය ටෙන්ඩර් පටිපාටි අනුගමනය කරයි. ප්‍රතිරක්ෂණ සේවා ප්‍රසම්පාදනය වැනි මහා පරිමාණ ප්‍රසම්පාදනයන්හිදී එය අමාත්‍ය මණ්ඩලය විසින් පත් කෙරුණ ප්‍රසම්පාදන කමිටුව හා අමාත්‍යාංශය විසින් පත් කෙරුණ ප්‍රසම්පාදන කමිටුව හරහා සිදු කරයි.

## මූල්‍ය පාලනය

විෂය පථය හා අභ්‍යන්තර හා බාහිර විගණන සැලසුම් විශ්ලේෂණය හා ඒ හා එකඟවීම්, අභ්‍යන්තර විගණන වාර්තා විශ්ලේෂණය, සාකච්ඡා හා අදාල ගැටළු, අවශ්‍ය අවස්ථාවල කළමණාකරණ පියවර, ජාතික රක්ෂණ භාර අරමුදලේ අවදානම් කළමණාකරන විශ්ලේෂණ, සාකච්ඡා හා අනාගත අවදානම් අවම කිරීම සඳහා අවශ්‍ය එකගවීම්, සෑම අවස්ථාවකම අභ්‍යන්තර හා බාහිර විගණකවරුන් සමග සඵලදායී සබඳතාවක් පවත්වා ගැනීම, අවශ්‍ය අවස්ථාවන්හිදී ජාතික රක්ෂණ භාර අරමුදලට අදාල කරුණු සාකච්ඡා කිරීම පිණිස අභ්‍යන්තර හා බාහිර විගණකවරුන් වෙන් වෙන් වශයෙන් හමුවීම වැනි විවිධ යාන්ත්‍රණයන් හරහා විගණන කමිටුව මූල්‍ය හා මූල්‍ය නොවන පාලන පද්ධතීන් සමීපව අධීක්ෂණය කරයි.

2013 වසර තුළදී විගණකාධිපති දෙපාර්තමේන්තුව විසින් බාහිර විගණනය පවත්වන ලදී. 2013 වසර තුළදී වර්ජන, කැරළි කෝලාහල හා සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල ඇතුළු, අංශ වල විගණනය ඇතුළු අභ්‍යන්තර විගණන කාර්යයන් අභ්‍යන්තර විගණන අංශය විසින් සිදුකරන ලදී.

## විගණන කමිටුව

2012 හා 2013 වසර තුළදී විගණන කමිටුව පහත සඳහන් විගණන විෂය පථය ස්ථාපිත කර අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

අභ්‍යන්තර විගණන අංශයේ වගකීම් හා තීරණය කිරීම හා වාර්ෂික විගණන සැලසුම් විශ්ලේෂණය.

1. ව්‍යාපාරයේ සියළු ක්‍රියාකාරකම් සඳහා අභ්‍යන්තර පාලන පද්ධති විශ්ලේෂණය හා ඇගයීම
2. පිරිවැය ඵලදායීත්වය හා නිෂ්ඵල වියදම් වැනි දෑ තුරන් කිරීම පිණිස නියමිත කාලයන් අතර කාර්යසාධන විශ්ලේෂණයන් සිදු කිරීම
3. බාහිර විගණක සමග සබඳතා පවත්වා ගැනීම හා විගණකාධිපති/ බාහිර විගණකගේ කළමණාකරන ලිපි අනුව කටයුතු කිරීම
4. ව්‍යවස්ථා, රෙගුලාසි, රීති හා චක්‍රලේඛ අනුගමනය කරන බවට සහතික වීම
5. ගිණුම්කරණ ප්‍රමිති අනුගමනය කරන බවට සහතික වීම පිණිස මූල්‍ය ප්‍රකාශ විශ්ලේෂණය කිරීම
6. අවශ්‍ය පියවර ගනු පිණිස වාර්ෂික අභ්‍යන්තර විගණන/ බාහිර විගණන වාර්තා , කළමණාකරන ලිපි විශ්ලේෂණය
7. රාජ්‍ය ව්‍යාපාර වෙත කමිටුවේ නිර්දේශ/මග පෙන්වීම් ක්‍රියාත්මක කිරීම පිලිබඳ විශ්ලේෂණය

2013 වසර තුළ විගණන කමිටුව අවස්ථා 9ක රැස්ව තිබේ. මූල්‍ය වාර්තාකරණය, බාහිර විගණනය, අනුගතවීම් හා නෛතික රෙගුලාසි, අවදානම් කළමණාකරනය, අභ්‍යන්තර පාලනය හා අභ්‍යන්තර විගණනය කෙරේ අවධානය යොමු කරමින් විගණන කමිටුව නීති හා රෙගුලාසිවලට අනුගතවීම, රක්ෂණ යෝජනා ක්‍රමයන්හී සඵලදායීත්වය කළමණාකරනය හා අධීක්ෂණය සහතික කරනු වස් නිසි පරිචයන් අනුගමනය කර තිබේ.

## 2013 වසර තුළ සංයුක්ත පාලන අනුකූලතාව

| සංයුක්ත පාලන මූලිකාංග | ජාතික රක්ෂණ භාර අරමුදලේ අනුකූලතා මට්ටම |
|---|---|
| සභාපති සහ ප්‍රධාන විධායක නිළධාරී | ප්‍රධාන විධායක නිළධාරී ගේ කාර්යභාර ය ඉටු කිරිම සභාපතිවරයාට මණ්ඩලය මගින් බලය පවරා ඇත. |
| වගකීම<br>විභේදනය | මණ්ඩලයේ නායකත්වය සඳහා සභාපතිවරයා වගකිව යුතුයි. විශේෂයෙන්ම සිදුවන කාර්ය ඉටු කරයි.<br>• මණ්ඩලය සම්බන්ධයෙන් කාර්යක්ෂම ආකාරයෙන් ක්‍රියාත්මක වීම සහ එහි කමිටු සමඟ උසස් සම්මත වූ ව්‍යවසාය පරිපාලනයක් සුරක්ෂිත කිරීම<br>• සංවර්ධන උපායමාර්ගය තුළ ජොෂ්ඨ කළමනාකාරීත්වයට සහයෝගය දැක්වීම සහ වඩාත් පුළුල් වශයෙන්, ජොෂ්ඨ කළමණාකාරීත්වයට උපදෙස් ලබාදීම හා සහයෝගය දැක්වීම කළ යුතුය. එක් එක් අංශයන්හි නායකත්වය පිළිබඳ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වගකිව යුතු අතර මණ්ඩලය මගින් අභිනියෝජනය කළ අධිකාරීන් තුළින් කළමනාකරණය සිදු කළ යුතුය.<br>• මණ්ඩලය මගින් නිර්දේශ කිරීම සඳහා උපායමාර්ග යෝජනා වැඩි දියුණු කිරීම සහ එම සම්මත වූ උපායමාර්ග ව්‍යාපාරය තුළට පරාවර්තනය කිරීම සුරක්ෂිත කිරීම<br>• මණ්ඩලයට සහයෝගය දැක්වීමට මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා සම්මත වූ උපායමාර්ග සමඟ වෙනස් නොවන වාර්ෂික සැලසුම් සංවර්ධනය කිරීම<br>• ආයතනයේ සැලසුම් වෙත ළඟා වීමට අවශ්‍ය කරන ධාරිතාවන් සහ සම්පත් සුරක්ෂිත කිරීම සඳහා මානව සම්පත් සැලසුම් කිරීම<br>• සංවිධානාත්මක ව්‍යුහයන් සංවර්ධනය කිරිම සහ කාර්යක්ෂම සංවිධානයන්වල සම්පත් සුරක්ෂිත කිරීම සඳහා පද්ධතීන් සහ ක්‍රියාදාමයන් පිහිටුවීම<br>• සම්මත සැලසුම්,උපායමාර්ගයන් සහ ප්‍රතිපත්තීන් සමඟ ව්‍යාපාරයේ කාර්යසාධනය තුළ සංගතභාවය සඳහා මණ්ඩලයට වගකිව යුතු වීම<br>• කාර්යසාධන සම්බන්ධතාවන් සහ ඇගයුම් සංවර්ධනය ඇතුළත්ව, විධායක කමිටුවට මඟ පෙන්වීම<br>• ආයෝජනයේ ප්‍රතිලාභ පාලනය කිරීම |
| ප්‍රසම්පාදන කමිටු | අංශ මට්ටමින් ප්‍රසම්පාදන කමිටු ස්ථාපිතව නොපවතී. ප්‍රසම්පාදනය සුළු පරිමාණද මහා |

| | |
|---|---|
| | පරිමාණද යන්න සලකා එක් එක් අවස්ථාවට උචිත පරිදි ප්‍රසම්පාදනයේ වටිනාකම මත කමිටුව පත් කරනු ලබයි. |
| විගණන කමිටුව | විගණන කමිටුව විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙක්ගෙන් සමන්විත වේ. විගණන කමිටුව එහි වගකීම පවත්නා මූල්‍යමය සහ පරිපාලනය තුළ ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරයි.<br><br>**විගණන කමිටුව**<br><br>*2013*වර්ෂය තුලදී විගණන කමිටුව පිහිටවනු ලැබූ අතර එහි විෂය පථය පහත දක්වා ඇති පරිදි වේ.<br><br>***1.*** අභ්‍යන්තර විගණන ඒකකයෙහි වගකීම් නිශ්වය කරලීම සහ වාර්ෂික විගණන සැලසුම් සමාලෝචනය<br>***2.*** ආයතනයේ සියළුම ක්‍රියාකාරකම් අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය සහ ඇගයීම<br>***3.*** පිරිවැය ඵලදායිතාව සඳහා කාර්ය සාධනය නිතිපතා සමාලෝචනය සහ අපතේ යන වියදම් ආදිය දුරලීම<br>***4.*** බාහිර විගණන සමඟ සමායෝජනය හා විගණකාධිපතිවරයාගේ බාහිර කළමනාකරණ ලිපිවල සඳහන් උපදෙස් අනුගමනය කිරීම<br>***5.*** අණපනත් නීති රීති සහ චක්‍රලේඛවලට අනුකූලව ක්‍රියාකරනු ලබන බැව් නිශ්චිත වශයෙන් සොයා දැන ගැනීම<br>***6.*** ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියා කිරීම සහතික කරගනු පිණිස මූල්‍ය ප්‍රකාශ සමාලෝචනය<br>***7.*** ප්‍රතිකර්ම වශයෙන් පියවර ගැනීම සහතික කරගනු පිණිස අභ්‍යන්තර විගණන/බාහිර විගණන වාර්තා කළමනාකරණ ලිපි සමාලෝචනය<br>***8.*** පොදු ව්‍යවසාය පිළිබඳ කාරක සභාවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම සමාලෝචනය කිරීම<br><br>2013 වර්ෂය තුළදී විගණන කමිටුව අවස්ථා 09 කදී රැස්ව ඇත. නීති සහ රෙගුලාසිවල යටත් වීම සහතික කිරීම මූල්‍ය වාර්තාකරණය කේන්ද්‍රගත කරගනිමින් ඵලදායි රක්ෂණ වැඩසටහන් කළමනාකරණය සහ මූල්‍යකරණය, බාහිර විගණනය, අවධානම් කළමනාකරණය, අනුකූලතාව දැක්වීම සහ නඩු කීම,අභ්‍යන්තර පාලනය සහ අභ්‍යන්තර විගණනය කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කර ඇත. |
| මණ්ඩල රැස්වීම් | මණ්ඩලය විසින් මෙහෙයවන ලද මණ්ඩල රැස්වීම් 15 ක් 2013 වර්ෂය තුළ පැවැත්වූ |

අතර රැස්වීමට සහභාගි වීමේ විශිෂ්ට වාර්තාවක් ද තබන ලදි. අධ්‍යක්ෂකවරුන්ගේ මණ්ඩල රැස්වීම්වලට සහභාගි වීමේ තොරතුරු පහත දැක්වේ.

| | දිනය | සහභාගි වූ රැස්වීම් ගණන |
|---|---|---|
| එස්.ඩී. අබේගුණසේකර මහතා සභාපති | 09.10.2012 | 15 |
| ආචාර්ය එල්. සමරවික්‍රම මහතා සාමාජික | 11.06.2010 | 15 |
| ඒ.කේ. සෙනෙවිරත්න මහතා සාමාජික | 08.07.2011 | 15 |
| එන්. කුලසේකර මහතා සාමාජික | 18.07.2011 | 13 |
| ජේ. දඩල්ලගේ මහතා සාමාජික | 23.06.2010 | 13 |
| ඩබ්.එච්. පියදාස මහතා සාමාජික | 10.07.2010 | 13 |

ඔවුන්ගේ නිලය දරන කාලය තුළ රැස්වීම්වලට සහභාගි වීම ඉහත පරිදි වේ.

යහ පාලන පරිචයන් කෙරේ සිය ඉහල ආචාරධාර්මික චර්යාකම්, වගවීම සහිතව කැපවීමෙන් සිය රාජකාරි ඉටු කිරීමට මණ්ඩල සාමාජිකයන් විසින් ප්‍රබල අවධානයක් යොමන ලදී. ප්‍රබල ව්‍යාපාරික ආචාරධර්ම, යහපත් ප්‍රතිපත්ති සහ පරිපාටි, සඵලදායී සහ කාර්යක්ෂම අධීක්ෂණ පද්ධති යන දෑ යහපත් සංයුක්ත පාලන පද්ධතියක අංග සේ සැලකේ.

මණ්ඩලයේ ප්‍රධානතම කාර්යයන් සහ වගකීම ආවරණය වන පරිදි සකස් කෙරුණු විධිමත් න්‍යාය පත්‍රයක් මත මණ්ඩල රැස්වීම් හසුරුවන ලදී. මණ්ඩලය විසින් අනුමත කරන ලද සහ විචාරය කරන ලද ආයතනයේ පස් අවුරුදු සංයුක්ත සැලැස්ම, ආයතනයේ කළමනාකරණය දෙසට අවශ්‍ය උපායමාර්ගික නියෝගය සපයනු ලදි.

| | |
|---|---|
| මූල්‍ය වාර්තාව | සකස් කරන ලද අන්තර්කාලීන සහ වාර්ෂික මූල්‍ය ප්‍රකාශ මෙන්ම ඉදිරියේදීත් සකස් කරනුයේ ද කාලානුරූප ආකාරයෙනි.<br><br>රජයේ අවශ්‍යතාව අනුව, ශ්‍රී ලංකා ගිණුම්කරණ සම්මතයන්ට අදාලව සහ අනුමැතිය තුළ ආයතනයේ පිරිස සහ මූල්‍ය ප්‍රකාශ සකස් කෙරෙන බවට මණ්ඩලය සුරක්ෂිත වෙයි.<br><br>• **වාර්ෂික වාර්තාව 2013**<br><br>මැනවින් සලකා බලන ලද තීරණ ගැනීම පිණිස 2013 වර්ෂය තුළදී ජාතික රක්ෂණ භාර අරමුදලේ කටයුතු පිළිබඳ සමස්ත තක්සේරුවක් ලබා දීමේ අරමුණ පෙරදැරි කරගෙන ජාතික රක්ෂණ භාර අරමුදලේ 2013 වාර්ෂික වාර්තාව සකස් කරනු ලැබ ඇත.<br><br>• **මූල්‍ය ප්‍රකාශ**<br><br>ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ස්වකීය මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් සහ අනෙකුත් අදාළ නීති සහ රෙගුලාසිවලට අනුව ඉදිරිපත් කරන ලදි. |



# 8. පාලන වාර්තාකරණය

# ව්‍යාපාර අවදානම් කළමනාකරණය

## හැඳින්වීම

සම්ප්‍රදායික වශයෙන් අවදානම යන්න නිර්වචනය කෙරෙනුයේ අනතුරක්, හානියක්, තුවාලයක් හෝ වෙනත් අහිතකර ප්‍රතිඵලයක් විය හැකියාව අනුසාරයෙනි. ගිණුම්කරනයේදී හා මූල්‍ය කළමණාකරනයේදී අවදානම යන්න තීරණ ක්‍රියාවලිය, වියහැකියාවේ ව්‍යාප්තිය, පිරිවැය-ප්‍රමාණය-ලාභ විශ්ලේෂණය, වට්ටම්ගත මුදල් ප්‍රවාහය, ප්‍රාග්ධන වත්කම් මිල කිරීමේ **ආකෘති** හා හෙජින් ශිල්ප ක්‍රම යනාදිය අනුව සැලකිල්ලට ගැනේ. අවදානම් කළමණාකරනය යනු සිය සියළු ක්‍රියාවලින් තුළ හා සංවිධාන අරමුණු හඹා යාමේදී තම ක්‍රියාකාරකම්වලට ප්‍රහාර එල්ලවන අවදානම්වලට සංවිධානයන් ක්‍රමානුකූලව මුහුණ දෙන ක්‍රියාවලියකි. සඵලදායී අවදානම් කළමණාකරනයට පහත දෑ අයත් වේ. අවදානම් තක්සේරුව, අවදානම් ඇගයුම, අවදානම් වෙනුවෙන් කටයුතු කිරීම, සහ අවදානම් වාර්තාකරණය යනුවෙනි. සාර්ථක අවදානම් කළමණාකරනයක අවධානය යොමු වන්නේ සංවිධානයේ අවදානම් විභවයන් අනුව ඒ අවදානම් හඳුනා ගැනීම හා පිලියම් යෙදීම කෙරෙහිය. ව්‍යාපාර අවදානම් කළමණාකරන ප්‍රවේශය යනු ව්‍යාපාර උපායක්‍රම සමග අවදානම් කළමණාකරනය එක එල්ලේ යොදවමින් ව්‍යාපාර මෙහෙයුම් තුළට අවදානම් කළමණාකරන සංස්කෘතියක් කාවැද්දීම වේ.

නිශේධාත්මක ප්‍රතිඵල වලක්වමින් බොහෝකොට ධනාත්මක ප්‍රතිඵල ලභා කර ගැනීම පිණිස වන ක්‍රියාවලියක් ලෙස පුද්ගල මට්ටමේ දී මෙය දකිනු ලබයි. කෙසේ වෙතත් සංවිධානයක අවදානම් කළමණාකරනය යනු වැඩි වශයෙන් ගත් කළ නිෂේධාත්මක ප්‍රතිඵල මග හැරීම පිලිබඳව වේ.

ව්‍යාපාර අවදානම් කළමණාකරනය යන්න ආයතනයේ ඉලක්ක ලභා කරගැනීම පිළිබඳ සාධාරණ තහවුරුවක් දීම පිණිස ඒ සම්බන්ධයෙන් ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය, කළමණාකරනය සහ අනෙක් පුද්ගලයන්, ආයතනයට බලපෑ හැකි අවදානම් විභවයන් හඳුනා ගැනීමට සැලසුම් කර ඇති, ව්‍යාපාරය තුළ උපාය මාර්ගික වශයෙන් භාවිතා කරන ක්‍රියාවලියක් සේ නිර්වචනය කළ හැකිය.,

ජාතික රක්ෂණ භාර අරමුදල මගින් භාවිතා කර ඇති ව්‍යාපාර අවදානම් කළමණාකරනය යන්නේ ප්‍රධාන මූලධර්මයන්ට පහත දෑ ඇතුලත් වේ.

- ව්‍යාපාර උපාය මාර්ගික සන්දර්භය තුළ සැලකිල්ලට ගැනීම
- ඉහල සිට පහලට සකසා ඇති ආයතනික ව්‍යුහය තුළ එය සැමගේ වගකීම වේ.
- මණ්ඩලය විසින් නායකත්වය දෙනු ලබන ඉලක්කගත උපායමාර්ගයකි.
- අවදානම ක්‍රියාකාරී ලෙස කළමණාකරනය කිරීම

- අවදානම් කළමණාකරනය වෙත විස්තීර්ණ හා සමස්ත ප්‍රවේශයක්
- පුළුල් අවදානම් පරාසයක් සැලකිල්ලට ගැනීම(උපාය මාර්ගික, මූල්‍ය, මෙහෙයුම් හා අනුකූලතා)
- අවදානම් කළමණාකරන රාමුවක් හෝ පද්ධතියක් තුළින් ක්‍රියාත්මක කිරීම

**01.**උපාය මාර්ගික අවදානම

උපාය මාර්ගික අරමුණු කරා ලඟාවීමට අසමත් වීමේ ඉඩකඩ උපාය මාර්ගික අවදානම යන්නට අදාල වේ. ජාතික රක්ෂණ භාර අරමුදලේ උපාය මාර්ගික අරමුණු කරා ලඟා වීමට පහසුකම් සලසනු වස් ජාතික රක්ෂණ භාර අරමුදලේ කළමණාකරනය අරමුදලේ උපායමාර්ගික අභිලාෂයට බලපානා රක්ෂණ ක්ෂේත්‍රයට අදාලව ශ්‍රී ලංකාවේ කාර්ය පරිසරය තුළ තරඟකරුවන්, හා පාරිභෝගික ගතිකයන් සාමාන්‍ය පරිසරයේ දේශපාලන, තාක්ෂණික, සමාජ සංස්කෘතික, ආර්ථික සංවර්ධනයන් විචක්ෂණ ලෙස අධීක්ෂණය කර තිබේ.

**02.** අවදානම් නිරාවරණය

කිසියම් රක්ෂකයකු හිමිකම් ඉල්ලීම් හි පිරිවැය ආවරණය කිරීමට අසමත් මිලකට අවදානමක් භාරගත් විට නිරාවරණ අවදානම පැන නගී. ජාතික රක්ෂණ භාර අරමුදල සිය පාරිභෝගිකයන්ට පිරිනමනා ලාභදායීත්වය, මිල හා කොන්දේසි යනාදිය නිරතුරු විමර්ශනයට ලක් කරයි. අවදානම් නිවැරදිව වර්ග කරන බවටත් අවදානම් වැලැක්වීමේ උපාය මාර්ග පිලිබඳ අදාල නිර්දේශ කරනා බවටත් සහතික කරනු වස් අවදානම් පාලනය පිණිස විශාල වශයෙන් වාරික තීරක කමිටුව අවදානම් තක්සේරු සිදු කරයි. රක්ෂණාවරන පිරිනැමීමට පෙර යෝජනා ආකෘති පත්‍ර, ඇතුළු සියළු තොරතුරු සියුම් පරීක්ෂාවට ලක් කිරීම රක්ෂණ කාර්ය මණ්ඩලයෙන් අපේක්ෂා කෙරේ. රක්ෂණ කාර්ය මණ්ඩලයට දෙනු ලබන පුහුණු හා සංවර්ධන අවස්ථාවන්ට අමතරව පටිපාටි අත්පොත් සපයන අතර අවශ්‍ය පරිදි ඒවා යාවත්කාලීන කෙරේ. ජාතික රක්ෂණ භාර අරමුදල ප්‍රමාණවත් ලෙස රාජකාරි බෙදා වෙන් කරන බවට සහතික වේ.

**03.**ජාත්‍යන්තර අවදානම

ජාත්‍යන්තර පරිසරයේ ඇති දේශපාලන, ආර්ථික, සමාජ-සංස්කෘතික, තාක්ෂණික කාරණාවන්හි උච්චාවචනයන් හේතුවෙන් ජාතික රක්ෂණ භාර අරමුදලේ ව්‍යාපාර කටයුතු වලට විය හැකි අහිතකර බලපෑම් මීට අදාල වේ.ජාතික රක්ෂණ භාර අරමුදලේ ව්‍යාපාරවලට සෘජු බලපෑමක් ඇති ජාත්‍යන්තර දේශපාලන සහ සමාජ-ආර්ථික ගතිකයන් ජාතික රක්ෂණ භාර අරමුදල විසින් අධීක්ෂණය කෙරේ. විශේෂයෙන්ම ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිරක්ෂණ අංශයට අදාලව ඇති ජාත්‍යන්තර ව්‍යාපාරික ප්‍රවණතා අධීක්ෂණය මීට ඇතුලත් වේ

**04.**ද්‍රවශීලතා අවදානම

ද්‍රවශීලතා අවදානම යනු මූල්‍ය වගකීම් සපුරා ලීම පිණිස මුදල් නොමැතිකම හෝ කෙටි කාලයක් තුළ මුදල් බවට පත් කරගත හැකි වත්කම් හිඟය වේ. ද්‍රවශීලතා අවදානම නෛතික හා ප්‍රතිරූප අවදානම වැනි අනෙක් අවදානම් හා මිශ්‍රවීමේ ප්‍රවණතාවක් පවතී. එහෙයින් ද්‍රවශීලතා අවදානම සම්බන්ධයෙන් මනා කළමණාකරනයක් පවත්වාගැනීම අත්‍යවශ්‍යය . හිමිකම් ඉල්ලීම් සඳහා ගෙවීම්, ප්‍රතිරක්ෂණ ගෙවීම්, හා භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම් වැනි ගිවිසුම්ගත බැඳීම් සපුරා ලීමේ අසමත්භාවය හෝ ද්‍රවශීලතා අවදානම ගිවිසුම් නැවත මිලදී ගැනීම් භාණ්ඩාගාර බිල්පත් (repos), භාණ්ඩාගාර බැඳුම්කර හා ණයකර වැනි විවිධ කල්පිරීම් සහිත අයෝජනයන් විවිධාංගීකරණය මගින් සමනය කරනු ලබයි.

**05.**අලෙවි/ව්‍යාපාර අවදානම

ව්‍යාපාර අවදානම පැන නැගෙන්නේ හුදෙක් ව්‍යාපාර කිහිපයකට පමණක් සාන්ද්‍රණය වන පමණක් විටය. අග්‍රහාර රක්ෂණ ක්‍රමය ලාභදායී ව්‍යාපාරයක් බවට පරිවර්තනය කිරීම, අනිවාර්ය රක්ෂණ ප්‍රතිශතය 20% සිට 30% දක්වා ඉහල නැංවීම, මෙන්ම වැඩ වර්ජන, සිවිල් අරගල, ත්‍රස්ත ක්‍රියා, රක්ෂණය, මෝටර් වාහන රක්ෂණය, විදෙස් රැකියා රක්ෂණය, සාමාන්‍ය රක්ෂණය වැනි ව්‍යාපාර වලට ප්‍රසාරණය කිරීම මගින් මෙය අවම කර ඇත.

**06.**මානව සම්පත් අවදානම

මානව සම්පත් ක්ෂේත්‍රයේ ප්‍රධාන අවදානම වනුයේ කර්මාන්තය පිණිස ඇවැසි වෘත්තිකයන් ගේ අප්‍රමාණවත් භාවයයි. මෙයට හේතුව වී ඇත්තේ සාපේක්ෂව සේවය හැර යාමේ අනුපාත ඉහල මට්ටමක පැවතීමයි. ජාතික රක්ෂණ භාර අරමුදලේ මානව සම්පත් ප්‍රතිපත්තිය ඉලක්ක කරනුයේ සියළු මට්ටම් වල සේවකයන් අධ්‍යාපනය හා සංවර්ධනය පිණිස අඛණ්ඩව සහය වීම කෙරෙහිය.

**07.** හිමිකම් නිරවුල් කිරීමේ අවදානම

වංචා, නෛතික හා තාක්ෂණික සාධක හේතුවෙන් පැන නගිනා ආරවුල් පිලිබඳ අවදානම පාලනය කරනුයේ හිමිකම් අනුමත කිරීමේ දැඩි නීති රීති පැනවීම, සමගින් පාරිභෝගික මිත්‍රශීලීත්වය රකිමින් හා හිමිකම් ඉල්ලීම් ක්‍රියාවලියේ රාජකාරි බෙදා වෙන් කිරීම සඳහා මූලාරම්භයන් සැපයීමෙනි.

**08.**විදේශ විනිමය හුවමාරු අවදානම

විදෙස් විනිමය හුවමාරු ගණුදෙනු අවදානම තුරන් කිරීම සඳහා ප්‍රතිරක්ෂණ වාරික ගෙවීමට දේශිය මුදල් වටිනාකමින් ගිවිසුම්වලට එළඹ තිබේ.

**09.**මෙහෙයුම් අවදානම

මෙහෙයුම් පරිගණක ගත කිරිමෙන් මෙහෙයුම් අවදානම අවම කෙරේ. වැඩ වර්ජන, සිවිල් අරගල, ත්‍රස්ත ක්‍රියා අරමුදල පිලිබඳ අභ්‍යන්තර විගණන කටයුතු කරන ලද්දේ අභ්‍යන්තර විගණන අංශයෙනි. ඒ වාරික රැස් කිරීමේ හා හිමිකම් ගෙවීමේ වැරදි හා අඩුපාඩු අවම කිරීමේ අදහසිනි. තවද වැරදි හා අඩුපාඩු අවම කිරීමේ අදහසින් කාර්යාල මෙහෙයුම් පරිගණකගත කර ඇත.

10.තොරතුරු තාක්ෂණ අවදානම

විවිධ පූර්වාරක්ෂක පියවර මගින් තොරතුරු තාක්ෂණ අවදානම ගැන කටයුතු කර තිබේ. **වෛ**වෙරස් ප්‍රහාර වැලැක්වීමේ අරමුණින් ජාතික රක්ෂණ භාර අරමුදලේ පරිගණකවලට සොපෝස් වෛරස් ආරක්ෂණ පැකේජය ඇතුල් කර තිබේ. බාධා රහිත විදුලි බල සැපයුම් පද්ධතිය හා බැක් අප් ගබඩා පද්ධතිය මගින් පද්ධති ගැටළු හේතුවෙන් පැන නගින හාණි අවම කෙරේ.

අවදානම් තක්සේරු න්‍යාසය

ජාතික රක්ෂණ භාර අරමුදලේ ප්‍රතිඵල- සිදුවීම් විශ්ලේෂණය මත පිහිටා පහත සඳහන් අවදානම් තක්සේරු න්‍යාසයේ **තීව්‍රභාවය** හා **සම්භාවිතා** සිදුවීම් මත අරමුදලේ ප්‍රධාන අවදානම් ප්‍රමුඛතාගත කර ඇත.

| | | සම්භාවිතාව | | | | |
|---|---|---|---|---|---|---|
| | | **1** | **2** | **3** | **4** | **5** |
| **තීව්‍රභාවය** | **1** | | | | | **R09** |
| | **2** | | | | **R04**<br>**R06** | |
| | **3** | | **R07**<br>**R05** | **R03** | **R02**<br>**R08** | |
| | **4** | | | **R10** | **R01** | |
| | **5** | **R06** | | | | |

**R01.**උපාය මාර්ගික අවදානම

**R02.**නිරාවරණ අවදානම

**R03.**ජාත්‍යන්තර අවදානම

**R04.**ද්‍රවශීලතා අවදානම

**R05.වෙළඳපල/ ව්‍යාපාර අවදානම**

**R06.**මානව **සම්පත් අවදානම**

**R07.** හිමිකම් පියවීමේ අවදානම

**R08.**විදේශ විනිමය හුවමාරු අවදානම

**R09.**මෙහෙයුම් අවදානම

**R10.**තොරතුරු තාක්ෂණ අවදානම



# 9. මූල්‍ය ප්‍රකාශ-2013

# ආදායම් ප්‍රකාශය

**2013 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා**

(ශ්‍රී ලංකා රුපියල් වලින්)

| | සටහන් | 2013 | 2012 |
|---|---|---|---|
| දළ ලිඛිත වාරික | | 4,168,033,208 | 3,120,006,892 |
| අග්‍රහාර සඳහා ලද දායකමුදල් | 1 | 1,406,706,842 | 863,435,521 |
| එකතු කළ කෘෂිරක්ෂණ බදු | 2 | 440,836,600 | - |
| නොඉපයූ වාරික සඳහා සංචිතවල ශුද්ධ වෙනස | | (563,257,987) | (95,954,471) |
| **දළ වාරික ඉපයුම්** | | 5,452,318,662 | 3,887,487,941 |
| ප්‍රතිරක්ෂණ සඳහා හැරදැමූ වාරික | | - | (1,304,600) |
| නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සඳහා සංචිතයන්හි ශුද්ධ වෙනස | | - | |
| **ශුද්ධ වාරික ඉපයුම්** | | **5,452,318,662** | **3,886,183,341** |
| **අනෙක් ආදායම්** | | | |
| මූල්‍ය ආදායම | 3 | 697,407,976 | 615,813,544 |
| ශුද්ධ උපලබ්ධි ලාභය | | 3,303,729 | - |
| අනෙක් මෙහෙයුම් ආදායම | | 861,272 | 26,164,498 |
| | | 701,572,977 | 641,978,043 |
| **මුළු ශුද්ධ ආදායම** | | **6,153,891,639** | **4,528,161,384** |
| **ප්‍රතිලාභ හිමිකම් සහ වියදම්** | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ හිමිකම් ඉල්ලීම් | 4 | (1,381,299,662) | (1,933,681,262) |
| ප්‍රාරක්ෂණ සහ අත්පත් කරගැනීමේ පිරිවැය | 5 | (382,177,026) | (347,789,490) |
| අනෙක් මෙහෙයුම් හා පරිපාලන වියදම් | 6 | (141,108,634) | (148,828,347) |
| මූල්‍ය පිරිවැය | | (8,459,075) | (14,839,119) |
| **මුළු ප්‍රතිලාභ හිමිකම් ඉල්ලීම් සහ වියදම්** | | **(1,913,044,397)** | **(2,445,138,218)** |
| **වියදම් මත ආදායම** | | **4,240,847,242** | **2,083,023,166** |

# ශේෂ පත්‍රය

**ජාතික රක්ෂණ භාර අරමුදල**
මූල්‍ය තත්ව ප්‍රකාශය

**2013** දෙසැම්බර් **31**න් අවසන් වසර සඳහා (ශ්‍රී ලංකා රුපියල් වලින්)

| වත්කම් | සටහන් | 2013 | 2012 |
|---|---|---|---|
| දේපල පිරියත හා උපකරණ | 07 | 19,317,968 | 24,739,202 |
| ආයෝජන | 08 | 6,667,518,021 | 5,375,914,672 |
| ලැබිය යුතු වාරික | 09 | 814,910,533 | 491,727,358 |
| මුදල් හා මුදල් සමාන දෑ | 10 | 305,495,813 | 103,641,397 |
| අනෙකුත් ලැබිය යුතු දෑ | 11 | 871,139,458 | 1,172,920,478 |
| **මුළු වත්කම්** | | **8,678,381,792** | **7,168,943,107** |
| **හිමිකම්** | | | |
| තාක්ෂණික සංචිත | | | |
| වෙනත් සංචිත | 12 | 1,622,656,295 | 1,059,398,308 |
| විලම්භිත කොමිස් | 13 | (199,173,169) | (176,532,688) |
| ආදායම් සංචිත | | | |
| සමුච්චිත අරමුදල | 14 | 6,950,664,274 | 5,912,918,517 |
| **මුළු හිමිකම් සහ සංචිත** | | **8,374,147,400** | **6,795,784,137** |
| ජංගම වගකීම් | | | |
| ගෙවිය යුතු හිමිකම් | 15 | 273,060,335 | 286,078,049 |
| අනෙකුත් ගෙවිය යුතුදෑ | 16 | 31,174,057 | 87,080,920 |
| **මුළු වගකීම්** | | **304,234,392** | **373,158,970** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **8,678,381,792** | **7,168,943,107** |

අරමුදලේ මූල්‍ය ප්‍රකාශ ශ්‍රී ලංකා ගිනුම්කරන ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කරමි

....................
මූල්‍ය කළමණාකරු

මූල්‍ය ප්‍රකාශ සැකසීම හා ඉදිරිපත් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

මණ්ඩලය වෙනුවෙන් අත්සන් කලේ 1. ....................

2. ....................

# ඒකාබද්ධ අරමුදලේ වෙනස්කම් පිලිබඳ ප්‍රකාශය

(ශ්‍රී ලංකා රුපියල් වලිනි)

| | 2013 | 2012 |
|---|---|---|
| වර්ෂාරම්භක ශේෂය | 5,912,918,517 | 8,497,449,708 |
| අඩුකළා-පෙර වසරේ ගැලපුම් මෝටර් වාහන | (5,964,896) | (467,554,357) |
| එකතුකළා-පෙර වසරේ ගැලපුම් වැඩවර්ජන,කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල | 2,863,411 | |
| ඒකාබද්ධ අරමුදලට ලබා දුන් දායකත්වය | (3,200,000,000) | (4,200,000,000) |
| රඳවාගත් ලාභ/(පාඩුව) වසර සඳහා | 4,240,847,242 | 2,083,023,166 |
| වර්ෂාවසාන ශේෂය | **6,950,664,274** | **5,912,918,517** |

# මුදල් ප්‍රවාහ ප්‍රකාශය

**2013 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා** (ශ්‍රී ලංකා රුපියල් වලින්)

| | 2013 | 2012 |
|---|---|---|
| ***මෙහෙයුම් ක්‍රියාකාරකුම්වලින් ඇතිවූ මුදල් ප්‍රවාහ*** | | |
| කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභ | 4,240,847,242 | 2,083,023,166 |
| අඩු කළා ඒකාබද්ධ අරමුදලට කරනු ලැබූ දායකත්වය | (3,200,000,000) | (4,200,000,000) |
| අඩු කළා- පෙර වසරේ ගැලපීම් | (3,101,485) | (467,554,357) |
| ***ගැලපීම්*** | 1,037,745,757 | (2,584,531,191) |
| ක්ෂය වීම් | 9,604,450 | 10,820,514 |
| | – | – |
| ශුද්ධ දේපල පිරියත විකිනීමෙන අලාභය | - | 1,731,806 |
| ආයෝජන ආදායම් | (691,472,899) | (615,813,544) |
| නොඉපයූ රක්ෂණ වාරික ආදායම් | 563,257,987 | 95,954,471 |
| විලම්භිත කොමිස් | (22,640,481) | (15,045,973) |
| ***කාරක ප්‍රාග්ධනය වෙනස්වීමට පෙර මෙහෙයුම් ලාභය*** | 896,494,813 | (3,106,883,918) |
| අයවිය යුතු දෙයෙහි වැඩිවීම්/අඩුවීම් | | |
| ගෙවිය යුතු හිමිකම් ඉල්ලීම් වල වැඩිවීම් | | |
| පෙර වර්ෂය සඳහා වු ගැලපීම් හේතුවෙන් ලාභයෙහි අඩුවීම් | (21,402,155) | 263,166,729 |
| ගෙවිය යුතු හිමිකම්වල අඩුවීම් | (13,017,714) | (106,332,722) |
| ගෙවිය යුතු වෙනත් ගිණුම් වල වැඩිවීම් | (55,906,863) | (166,039,128) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය** | 806,168,081 | (3,116,089,038) |
| ***ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලත් මුදල් ප්‍රවාහ*** | | |
| දේපල, පිරියත සහ උපකරණ මිලදී ගැනීම් | (4,183,215) | (8,154,600) |
| රජයේ සුරැකුම්පත්වල ආයෝජන ආපසු ගැනීම් | - | 469,956 |
| වත්කම් විකිණීම මගින් ලත් ලාභය | (1,291,603,348) | (931,368,410) |
| ආයෝජන ආදායම | 691,472,898 | 615,813,544 |
| **ආයෝජනය කිරීමේ ක්‍රියාකාරකම් සඳහා කළ ශුද්ධ මුදල් ප්‍රමාණය** | (604,313,665) | (323,239,510) |
| **මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම්/අඩුවීම්** | 201,854,416 | (3,439,328,548) |
| **කාල පරිච්ඡේදය ආරම්භයේ, මුදල් සහ මුදල් සමාන දෑ** | 103,641,397 | 3,542,969,945 |
| **කාල පරිච්ඡේදය අවසානයේ, මුදල් සහ මුදල් සමාන දෑ** | 305,495,813 | 103,641,397 |
| | - | - |
| | - | - |
| දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ | 305,495,813 | 103,641,397 |

# ගිණුම්කරන ප්‍රතිපත්ති

## 1.0 සංස්ථාපිත තොරතුරු

ජාතික රක්ෂණ භාර අරමුදල ('අරමුදල') "2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතින්" සංස්ථාගත කරන ලදුව, ශ්‍රී ලංකාව තුළ නිත්‍ය වශයෙන් පිහිටුවනු ලැබ ඇත. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 10, මරදාන පාර අංක 97 දරන ස්ථානයේ පිහිටා ඇති අතර එහි ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ද මෙකී ලිපිනයෙහි පිහිටා තිබේ.

## 2.0 වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

### 2.1 පිළියෙල කිරීමේ පදනම

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නියම කරනු ලැබූ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට හා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කරනු ලැබ ඇත.

මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරනු ලබනුයේ ශ්‍රී ලංකා රුපියල් වලිනි.

උද්ධමනකාරී සාධක වෙනුවෙන් ගැලපීම් කිසිවක් මේ ගිණුම්වලට ඇතුළත් කෙරී නොමැත.

අදාළ විටදී, ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉදිරි සටහන්වල පැහැදිලි කරනු ලැබ ඇත.

### 2.2 තුලනාත්මක අගයන්

අරමුදල විසින් දිගටම අදාළ කෙරුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති ඉකුත් වර්ෂයන්හි භාවිත කෙරුණු පිළිවෙත් වලට අනුකූල වේ. අවශ්‍ය තන්හි දී ඉකුත් වර්ෂයේ අගයන් යළි පෙළගස්වා මේ වර්ෂයේ ඉදිරිපත් කිරීමට ඇතුළත් කෙරී ඇත.

### 2.3 ප්‍රාග්ධන බැඳීම

ශේෂ පත්‍රයෙහි දිනට ප්‍රාග්ධන බැඳීම් කිසිවක් නොතිබිණි.

# ගිණුම්කරන ප්‍රතිපත්ති

## 2.4 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහන ප්‍රකාශය පිළියෙළ කරනු ලැබ ඇත්තේ "වක්‍ර ක්‍රමය " භාවිතයෙනි.

## 2.5 ආශ්‍රිත පාර්ශව ගනුදෙනු

ආශ්‍රිත පාර්ශව ගනුදෙනු කිසිවක් නොතිබිණි.

## 2.6 පශ්චාත් ශේෂ පත්‍ර කාර්යදාම

සියලුම සැලකිය යතු පශ්චාත් ශේෂපත්‍ර කාර්යදාමයන් සැලකිල්ලට භාජනය කරන ලදුව අදාළ තන්හිදී මූල්‍ය ප්‍රකාශයන්හි ඒ ඒ සටහන්වල ගැළපීම් හෝ කරුණු අනාවරණය කිරීම් ඇතුළත් කරනු ලැබ තිබේ.

## 2.7 වත්කම් සහ ඒවා ඇගයීමේ පදනම

### 2.7.1 දේපළ, පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ඒවායෙහි පිරිවැය අනුව සටහන් ගත කොට තිබේ.

දේපළ, පිරියත සහ උපකරණ යනු එකී වත්කම්, එහි අපේක්ෂිත පරිහරණය සඳහා ක්‍රියාකාරී තත්ත්වයන්ට පමුණුවාලීමේදී වැයවුණු කිසියම් වියහියදම් සමඟ ඒවායෙහි ගැනුම් මිල වෙයි.

අරමුදල පවත්වාගෙන යාම සඳහා තිර ස්වභාවයේ වත්කම් අත්කර ගැනීම, දීර්ඝ කරලීම හෝ වැඩි දියුණු කරලීම සඳහා වැය වූ වියහියදම්.

**ක්ෂයවීම්**

සියලුම දේපළ, පිරියත හා උපකරණවල ක්ෂයවීම් සඳහා වන ප්‍රතිපාදන ගණනය කෙරෙනුයේ ඒවායෙහි ඇස්තමේන්තු ගත, ප්‍රයෝජනවත් ජීවිත කාලය මත පහත සඳහන් පරිදි සමාන වාර්ෂික වාරික වලින් කපාහරිනු පිණිස ඒවායෙහි වටිනාකම මත සරල මාර්ග ක්‍රමය යොදා ගනිමිනි.

| | |
|---|---|
| පිරියත සහ යන්ත්‍රෝපකරණ | - අවුරුදු 10 |
| ගෘහ භාණ්ඩ හා සවිකිරීම් | - අවුරුදු 08 |
| කාර්යාල උපකරණ | - අවුරුදු 06 |
| පරිගණක | - අවුරුදු 05 |
| මෝටර් වාහන | - අවුරුදු 05 |

# ගිණුම්කරන ප්‍රතිපත්ති

### 2.7.2 ආයෝජන

පිරිවැය අනුව ආයෝජන දක්වා ඇත.

### 2.7.3 ලැබිය යුතු දෑ

වාරික, පොළිය සහ අනෙකුත් ලැබිය යුතු දෑ එකතු කර ගැනීමට ඇති හැකියාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ පදනම් මත සමාලෝචනය කරනු ලැබේ.

එකතු කර ගැනීමට අපහසු ලෙස හඳුනාගෙන ඇති ණය ගැතියන් සහ අනෙකුත් ලැබිය යුතු දෑ කපාහරිනු ලැබේ.

### 2.7.3 මුදල් හා මුදල් සමාන දෑ

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි කාර්යය සඳහා මුදල් සහ මුදල් සමාන දෑ අතැති මුදල් සහ ශුද්ධ නොගෙවූ බැංකු අයිරා හා  වූ බැංකු තැන්පතුවල ශුද්ධ අගයෙන් සංයුක්ත වේ.

## 2.8 බැරකම් හා ප්‍රතිපාදන

### 2.8.1 නොඉපයූ වාරික

නොඉපයූ වාරික යනු ශේෂ පත්‍රයෙහි දිනට පසුව යෙදුණු අවදානම් කාල පරිච්ඡේදයට අදාළ වන වර්ෂයක් තුළ දී ලිඛිත වාරිකවල සමානුපාතයන්යග මේ නොඉපයූ වාරික දළ වාරිකයෙහි 24 වැනි පදනම මත ගණනය කෙරේ.

### 2.8.2 විලම්බිත කොමිස් මුදල

විලම්බිත කොමිස් මුදලෙන් පෙන්නුම් කෙරෙනුයේ නොඉපයූ වාරිකයට අදාළ ශුද්ධ කොමිස් මුදලය.

# ගිණුම්කරන ප්‍රතිපත්ති

2.8.3 **ලාභ කොමිස් මුදල**

ලාභ කොමිස් මුදල ගණනය කොට වාරික දෙකකින් ගෙවනු ලැබේ. පළමු වාරිකය ගිණුම් කාල පරිච්ඡේදය අවසන් වී සය මසකින් සහ දෙවැනි වාරිකය ගිණුම් කාල පරිච්ඡේදය අවසන් වී දොළොස් මසකින් ගෙවනු ලැබේ.

**2.8.4 ගෙවීමට ඇති හිමිකම් පෑම**

හිමිකම්පෑම් අදාළ මුදල් වර්ෂය තුළ දී නොගෙවන ලද අනුමත හිමිකම්පෑම් වලින් ද අරමුදලෙහි සාමාජිකයින් විසින් ප්‍රකාශයට පත් කෙරෙන ගෙවීමට ඉතිරිව ඇති හිමිකම්පෑම් සඳහා කෙරෙන ප්‍රතිපාදනවලින් සහ ප්‍රතිරක්ෂණය සහ සුන්බුන් අයකර ගැනීම් වෙතොත් ඒ සඳහා අදාළ වියදම් හා ඒ වෙනුවෙන් කෙරෙන ප්‍රතිපාදනවලින් ද සංයුක්ත වේ.

.

**2.8.5 අනෙකුත් ගෙවිය යුතු දෑ**

අනෙකුත් ගෙවිය යුතු දෑ ඒවායෙහි පිරිවැයෙහි දක්වා ඇත.

2.8.6 **වෙනත් ප්‍රතිපාදන**

ශේෂ පත්‍රයෙහි දිනට හඳුනාගත් සියලුම ප්‍රතිපාදන සඳහා ගිණුම්වල පූර්ණ වශයෙන් වෙන් කිරීම් කර ඇත.

**2.9 ආදායම් හා වියදම්**

**2.9.1 ආදායම**

ආර්ථික ප්‍රතිලාභ, අරමුදල කරා ගලා ඒමේ සම්භාවිතාවයේ ප්‍රමානයට සහ ආදායම විශ්වසනීය අයුරින් ගණනය කිරීමට හැකිවීමේ ප්‍රමාණයට ආදායම හඳුනාගනු ලැබේ. ආදායම හඳුනා ගැනීමට පෙරාතුව මතු දැක්වෙන නිශ්චිත හඳුනා ගැනීමේ උපමාන ද සපුරාලීම අනිවාර්ය වෙයි.

# ගිණුම්කරන ප්‍රතිපත්ති

**(අ) වාරික දායකත්වය**

වාරික දායකත්වය ඒවා ගෙවීම් කළ යුතු කාලය එළඹීමේදී හඳුනාගනු ලැබේ.

**(ආ) පොලී ආදායම**

ඉදිරියේදී එකතුකර ගැනීම් සැකසහිත වෙතොත් මිස පොලිය උපචිතවීමේදී පොලී ආදායම හඳුනාගනු ලැබේ.

2.9.2 **වියදම් හඳුනාගැනීම**

අරමුදල පවත්වාගෙන යාමේදී සහ දේපළ, පිරියත සහ උපකරණ කාර්යක්ෂම තත්ත්වයෙහි පවත්වාගෙන යාමේදී වැය වන සියලුම වියදම් ද ශුද්ධ අතිරික්තය ලබා ගැනීමේදී ආදායමට බැර කරනු ලැබ ඇත.

2.10. අවිනිශ්චිතතාවන්

මණ්ඩලයේ මතය අනුව සාමාන්‍ය ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් ජාතික රක්ෂණ භාර අරමුදලට එරෙහිව දැනට පවත්නා නඩු කටයුතු වලින් වාර්තාකරණ ලද මූල්‍ය ප්‍රතිඵලයන්ට හා අරමුදලේ අනාගතමෙහෙයුම්වලට සැලකිය යුතු බලපෑමක් ඇති නොවේ.

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

**දෙසැම්බර් 31 අවසන් වන වසර සඳහා**

**01** ලිඛිත දළ වාරික (සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි)

ප්‍රධාන ව්‍යාපාරික පංතීන් වෙතින් වසර සඳහා වාරික ආදායම පහත පරිදි වේ.

| | 2013 | 2012 |
|---|---|---|
| ප්‍රතිරක්ෂණ | 1,042,220,495 | 463,610,216 |
| වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල | 2,543,782,803 | 2,281,176,063 |
| සාමාන්‍ය රක්ෂණ- මෝටර් වාහන | 174,785,654 | 206,595,378 |
| සාමාන්‍ය රක්ෂණ- වෛද්‍ය සහ අනෙක් | 17,915,562 | 158,625,235 |
| කෘෂි රක්ෂණ- ගොවීන් වෙතින් ලද වාරික | 379,328,695 | - |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් උදෙසා වන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 10,000,000 | 10,000,000 |
| ලිඛිත දළ වාරික එකතුව | **4,168,033,208** | **3,120,006,892** |

**02** **අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය වෙනුවෙන් රැස් කරන ලද දායක මුදල්**

| | 2013 | 2012 |
|---|---|---|
| සාමාජිකයන්ගෙන් දායක මුදල් | 996,706,842 | 588,435,521 |
| භාණ්ඩාගාරයෙන් දායක මුදල් | 410,000,000 | 275,000,000 |
| අග්‍රහාර වෙනුවෙන් රස්කරන ලද මුළු දායක මුදල් | **1,406,706,842** | **863,435,521** |

**03** **මූල්‍ය ආදායම**

| | 2013 | 2012 |
|---|---|---|
| **කල් පිරෙන තෙක් යන වර්ගීකරණය යටතේ ඇති මූල්‍ය වත්කම් වලින් ලද ආදායම** | | |
| භාණ්ඩාගාර බැඳුම්කර | 237,289,715 | 118,010,121 |
| ණයකර | 115,350,967 | 114,720,633 |
| | **352,640,682** | **232,730,755** |
| **විකිණීම සඳහා යනුවෙන් වර්ග කර ඇති මූල්‍ය වත්කම් වලින් ලද ආදායම** | | |
| භාණ්ඩාගාර බිල්පත් | 52,770,580 | 53,317,809 |
| යළි මිලදී ගැනුම් සඳහා වන ගිවිසුම් | 286,061,637 | 329,764,980 |
| | **338,832,218** | **383,082,790** |
| **මුළු මූල්‍ය ආදායම** | **691,472,899** | **615,813,544** |

04 **ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ හිමිකම්**

| | 2013 | 2012 |
|---|---|---|
| ප්‍රතිරක්ෂණ | 20,730,824 | 308,239,012 |
| වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල | 2,331,835 | 37,076,159 |
| සාමාන්‍ය රක්ෂණ- මෝටර් වාහන | 116,636,252 | 115,629,748 |
| සාමාන්‍ය රක්ෂණ- වෛද්‍ය සහ අනෙක් | 85,707,270 | 404,869,568 |
| කෘෂි රක්ෂණ | 10,436,648 | - |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් උදෙසා වන වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 15,333,763 | 12,564,947 |
| අග්‍රහාර වෛද්‍ය රක්ෂණ ක්‍රමය | 1,130,123,071 | 1,055,301,828 |
| **මුළු ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ හිමිකම්** | **1,381,299,662** | **1,933,681,262** |

05 **ප්‍රාරක්ෂණ සහ අත්පත් කරගැනීමේ පිරිවැය**

| | 2013 | 2012 |
|---|---|---|
| ප්‍රාරක්ෂණ සහ ඔප්පු අත්පත් කරගැනීමේ පිරිවැය | 404,817,508 | 347,789,490 |
| විලම්භිත අත්පත් කරගැනීම් පිරිවැය සඳහා සංචිතයේ ශුද්ධ වෙනස | (22,640,481) | |
| **මුළු ප්‍රාරක්ෂණ සහ අත්පත් කරගැනීමේ පිරිවැය** | **382,177,026** | **347,789,490** |

(වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල)

06 **වෙනත් මෙහෙයුම් හා පරිපාලන වියදම්**

| | 2013 | 2012 |
|---|---|---|
| විගණකවරුන්ගේ පාරිශ්‍රමික | 337,500 | 338,160 |
| සේවක ප්‍රතිලාභ සඳහා වියදම් | 76,487,490 | 72,006,709 |
| පරිපාලන හා ආයතන වියදම් | 52,770,118 | 63,125,974 |
| විකුණුම් වියදම් | 808,660 | 1,186,145 |
| දේපල පිරියත හා උපකරණ ක්ෂයවීම් | 9,604,450 | 10,820,514 |
| නීති ගාස්තු | 521,386 | 902,115 |
| පරිත්‍යාග | 579,030 | 448,730 |
| | **141,108,634** | **148,828,347** |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින්)

**07** **දේපල පිරියත සහ උපකරණ**

| | මෝටර්වාහන | කාර්යාල උපකරණ | ලී බඩු සහ උපකරණ | මෘදුකාංග | විවිධ වත්කම් | මුළු එකතුව |
|---|---|---|---|---|---|---|
| **පිරිවැය** | | | | | | |
| 2013/01/01 දිනට ශේෂය | 34,470,255 | 30,928,294 | 6,438,328 | 6,542,073 | 71,988 | **78,450,938** |
| එකතුකිරීම් | - | 3,531,635 | 651,580 | - | - | **4,183,215** |
| අපහරණයන් | - | - | - | - | - | **-** |
| **2013/12/31 දිනට ශේෂය** | **34,470,255** | **34,459,929** | **7,089,908** | **6,542,073** | **71,988** | **82,634,153** |
| **ක්ෂයවීම්** | | | | | | |
| 2013/01/01 දිනට ශේෂය | 28,767,528 | 15,400,576 | 3,069,217 | 6,448,518 | 25,897 | **53,711,736** |
| වසර සඳහා ගාස්තු | 4,294,991 | 4,421,737 | 811,355 | 76,367 | - | **9,604,450** |
| වර්ෂයේ අපහරණයන් | - | - | - | - | - | **-** |
| **2013/12/31 දිනට ශේෂය** | **33,062,519** | **19,822,313** | **3,880,571** | **6,524,886** | **25,897** | **63,316,185** |
| | | | | | | **-** |
| 2013.12.31 දිනට ලියා අඩු | **1,407,736** | **14,637,617** | **3,209,337** | **17,188** | **46,091** | **19,317,968** |
| | | | **2013** | **2012** | | |

**08** **මූල්‍ය ආයෝජනයන්**

| | 2013 | 2012 |
|---|---|---|
| භාණ්ඩාගාර බිල්පත් | 1,933,202,150 | 628,369,600 |
| භාණ්ඩාගාර බිල්පත් REPO | 1,477,410,933 | 2,031,982,426 |
| භාණ්ඩාගාර බැඳුම්කර | 2,400,627,345 | 1,694,634,700 |
| ණයකර | 1,045,780,000 | 1,045,780,000 |
| **අඩුකළා** | | |
| වට්ටම් ලියා හැරීම් | (189,502,408) | (26,380,841) |
| **එකතුකළා** | | |
| හිලව් නොකළ වාරික | - | 1,528,787 |
| මූල්‍ය ආයෝජන එකතුව | **6,667,518,021** | **5,375,914,672** |

**09** **ලැබිය යුතු වාරික**

| | 2013 | 2012 |
|---|---|---|
| ප්‍රතිරක්ෂණ | 462,968,508 | 180,811,195 |
| වැවසිඅත්‍රකි වාරික | 349,986,352 | 308,960,490 |
| සාමාන්‍ය රක්ෂණ මෝටර් වාහන | | - |
| සාමාන්‍ය රක්ෂණ-වෛද්‍ය සහ අනෙක් | 1,955,673 | 1,955,673 |
| ලැබිය යුතු මුළු වාරික | **814,910,533** | **491,727,358** |

**10** **මුදල් හා මුදල් සමාන දෑ**

| | 2013 | 2012 |
|---|---|---|
| **බැංකුවේ ඇති මුදල්** | | |
| මහජන බැංකුව ජංගම-අග්‍රහාර-033100142467951 | (645,717) | (648,259) |
| මහජන බැංකුව ඉතුරුම්-අග්‍රහාර-033200122467951 | 20,404,203 | 18,301,965 |
| මහජන බැංකුව-ජංගම-මෝටර්වාහන-033100160000058 | 721,004 | 7,215,905 |
| මහජන බැංකුව-ජංගම-ප්‍රතිරක්ෂණ-033100100000061 | 1,815,444 | 6,702,652 |
| මහජන බැංකුව-ජංගම-වගා රක්ෂණ-033100502467951 | 22,913,768 | - |
| මහජන බැංකුව-ජංගම-විදේශීය-033100150000228 | 598,614 | (1,820,075) |
| මහජන බැංකුව RFC යුරෝ ගිණුම-033407132467951 | 10,517,416 | 9,655,662 |
| මහජන බැංකුව RFC ඇ.ඩොගිණුම-033402142467951 | 163,459,183 | 89,322,297 |
| මහජන බැංකුව ඉතුරුම්-කෘෂි බදු-033200302467951 | 313,452 | - |
| මහජන බැංකුව-ජංගම-නව-033100322467951 | (54,516,844) | (37,644,867) |
| මහජන බැංකුව-ජංගම-මධ්‍යම-033100412467951 | 303,339 | 841,653 |
| පැන් ඒෂියා බැංකුව-ඉතුරුම්-සාමාන්‍ය-312948280215 | 1,191,137 | 1,116,214 |
| මහජන බැංකුව ඉතුරුම්-සාමාන්‍ය-033200212467951 | 297,240 | 1,782,590 |
| මහජන බැංකුව-ජංගම ගිණුම් අංක - 14100127679733 | 137,478,867 | 8,176,291 |
| ලංකා බැංකුව ජංගම ගිණුම් අංක - 0006573953 | 501,122 | 500,000 |
| **අතැති මුදල්** | 143,584 | 139,369 |
| මුදල් හා මුදල් සමාන දෑ එකතුව | **305,495,813** | **103,641,397** |

# මූල්‍ය ප්‍රකාශ සඳහා සටහන්

(ශ්‍රී ලංකා රුපියල් වලින්)

**11 අනෙකුත ලැබිය යුතු දෑ**

| | 2013 | 2012 |
|---|---|---|
| ලැබිය යුතු පොලිය | 160,516,011 | 149,310,648 |
| ආර්ථික සේවා ගාස්තු | 12,092,199 | 11,078,483 |
| ප්‍රතිරක්ෂණ අංශයෙන් ලැබිය යුතු | 0 | 5,349,749 |
| වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල ලැබිය යුතු | 8,844,083 | - |
| මෝටර් වාහන අංශයෙන් ලැබිය යුතු | 973,009 | _ |
| ලැබිය යුතු අත්තිකාරම් | 1,056,376 | 481,841 |
| මෘදුණය | 622,760,214 | 958,456,782 |
| ලැබිය යුතු රඳවා ගැනීම් බදු | 34,618,240 | 23,114,660 |
| ආපසු ගෙවනු ලබනා තැන්පතු | 9,415,854 | 9,800,688 |
| කාර්ය මණ්ඩල ණය | 19,074,595 | 13,553,748 |
| පෙර ගෙවූ වියදම් | 7,819 | 5,092 |
| අගරු චෙක් වෙනුවෙන් සාමාජිකයන්ගෙන් ලැබිය යුතු | 1,781,057 | 1,768,785 |
| | **871,139,458** | **1,172,920,478** |

**12 අනෙකුත් සංචිත**

| | | 2013 | 2012 |
|---|---|---|---|
| **නොඉපයූ වාරික** | | | |
| වර්ෂාරම්භක ශේෂය | | 1,059,398,308 | 963,443,837 |
| **වර්ෂය සඳහා ප්‍රතිපාදන** | | | |
| වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල | 137,305,835 | | 95,954,471 |
| සාමාන්‍ය රක්ෂණ මෝටර් වාහක | 61,174,979 | | |
| ප්‍රතිරක්ෂණ | 364,777,173 | 563,257,987 | |
| වර්ෂාවසාන ශේෂය | | **1,622,656,295** | **1,059,398,308** |

**විලම්බිත කොමිස්**

| | | 2013 | 2012 |
|---|---|---|---|
| 13 | වර්ෂාරම්භක ශේෂය | 176,532,688 | 161,486,715 |
| | **වර්ෂය සඳහා ප්‍රතිපාදන** | 22,640,481 | 15,045,973 |
| | වර්ෂාවසාන ශේෂය | **199,173,169** | **176,532,688** |

**සමුච්චිත අරමුදල**

| | | 2013 | 2012 |
|---|---|---|---|
| 14 | වර්ෂාරම්භක ශේෂය | 5,912,918,517 | 8,497,449,708 |
| | වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල | | |
| | අඩුකළා- පෙර වසරේ ගැලපුම්- වාහන | (5,964,896) | (467,554,357) |
| | වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද | 2,863,411 | |
| | අරමුදල-එකතු කලා- පෙරවසරේ ගැලපුම් | | |
| | ඒකාබද්ධ අරමුදලට ලබා දුන් දායකත්වය | (3,200,000,000) | (4,200,000,000) |
| | වසර සඳහා රඳවාගත් ලාභ/පාඩු | 4,240,847,242 | 2,083,023,166 |
| | වර්ෂාවසාන ශේෂය | **6,950,664,274** | **5,912,918,517** |

**ගෙවිය යුතු හිමිකම් ඉල්ලීම්**

| | | 2013 | 2012 |
|---|---|---|---|
| 15 | ප්‍රතිරක්ෂණ | 86,530,984 | 113,798,695 |
| | | 66,665,233 | 79,783,010 |
| | සාමාන්‍ය රක්ෂණ මෝටර් වාහක | 13,505,808 | 4,326,944 |
| | සාමාන්‍ය රක්ෂණ-වෛද්‍ය සහ අනෙක් | 2,236,590 | 2,236,590 |
| | වගා රක්ෂණ | 4,738,899 | - |
| | අග්‍රහාර වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය | 99,382,821 | 85,932,811 |
| | | **273,060,335** | **286,078,050** |

**ගෙවිය යුතු අනෙකුත් දෑ**

| | | 2013 | 2012 |
|---|---|---|---|
| 16 | සමුච්චිත වියදම් | 2,980,920 | 11,021,633 |
| | අනෙකුත් ගෙවිය යුතු දෑ | 5,189,573 | 1,381,289 |
| | ගෙවිය යුතු- වැඩ වර්ජන කැරළි කෝලාහල, සිවිල් අරගල හා ත්‍රස්තවාද අරමුදල | - | 8,075,322 |
| | පාරිතෝෂික ගෙවීම් සඳහා ප්‍රතිපාදන | 7,799,474 | 2,897,037 |
| | ගෙවිය යුතු මාර්ග ආරක්ෂණ බදු | 446,907 | 527,485 |
| | ගෙවිය යුතු වාරික ආපසු ගෙවීම් | 11,928,872 | 11,844,581 |
| | ලාභ මත ගෙවිය යුතු කොමිස් මුදල් | 12,287,375 | 12,287,375 |
| | හිමිකම් ඉල්ලීම් චෙක්පත්/අගරු වූ පත්‍රිකා මගින් ගෙවිය යුතු | 4,254,343 | 2,801,352 |
| | ගෙවිය යුතු විගණන ගාස්තු | 640,000 | 460,000 |
| | ගෙවිය යුතු වැට් හා ජා.ගො.නැ. බදු | (14,353,408) | 35,784,845 |
| | | **31,174,057** | **87,080,920** |

# කාණ්ඩික සමාලෝචනය

**2013 දෙසැම්බර් 31න් අවසන් වසර සඳහා** ශ්‍රී ලංකා රුපියල් වලිනි

| | සාමාන්‍ය | | | | සෞඛ්‍ය | කෘෂි රක්ෂණ | |
|---|---|---|---|---|---|---|---|
| | මෝටර් වාහන | වෛද්‍ය සහ අනෙක් | ප්‍රතිරක්ෂණ | වැවසිඅ ත්‍රකිඅ | අග්‍රහාර/පාම | යෝජනා ක්‍රමය | මුළු |
| දළ ලිඛිත වාරික | 174,785,654 | 17,915,562 | 1,042,220,495 | 2,543,782,803 | 10,000,000 | 379,328,695 | 4,168,033,208 |
| අග්‍රහාර සඳහා ලද දායකමුදල් | | | | | 1,406,706,842 | | 1,406,706,842 |
| එකතු කළ කෘෂිරක්ෂණ බදු | | | | | | 440,836,600 | 440,836,600 |
| නොඉපයූ වාරික සඳහා සංචිතවල ශුද්ධ වෙනස | (61,174,979) | | (364,777,173) | (137,305,835) | | | (563,257,987) |
| **දළ වාරික ඉපයුම්** | 113,610,675 | 17,915,562 | 677,443,322 | 2,406,476,968 | 1,416,706,842 | 820,165,295 | 5,452,318,662 |
| ප්‍රතිරක්ෂණ සඳහා හැරදැමූ වාරික | - | - | - | - | - | - | - |
| නොඉපයූ ප්‍රතිරක්ෂණ වාරික සඳහා සංචිතයන්හි ශුද්ධ වෙනස වීම් | - | - | - | - | - | - | - |
| **ශුද්ධ වාරික ඉපයුම්** | **113,610,675** | **17,915,562** | **677,443,322** | **2,406,476,968** | **1,416,706,842** | **820,165,295** | **5,452,318,662** |
| **අනෙක් ආදායම්** | | | | | | | |
| මූල්‍ය ආදායම | 49,189,560 | 26,659,065 | 54,875,913 | 553,939,123 | 2,388,510 | 10,355,805 | 697,407,976 |
| ශුද්ධ උපලබ්ධි ලාභය | | | 3,303,729 | - | | | 3,303,729 |
| අනෙක් මෙහෙයුම් ආදායම | 722,996 | 136,776 | | 1,500 | | | 861,272 |
| | 49,912,556 | 26,795,840 | 58,179,642 | 553,940,623 | 2,388,510 | 10,355,805 | 701,572,977 |
| **මුළු ශුද්ධ ආදායම** | **163,523,231** | **44,711,402** | **735,622,964** | **2,960,417,591** | **1,419,095,352** | **830,521,100** | **6,153,891,639** |
| **ප්‍රතිලාභ හිමිකම් සහ වියදම්** | | | | | | | |
| ශුද්ධ රක්ෂණ ප්‍රතිලාභ සහ හිමිකම් ඉල්ලීම් | (116,636,252) | (85,707,270) | (20,730,824) | (2,331,835) | (1,145,456,834) | (10,436,648) | (1,381,299,662) |
| | - | - | - | (382,177,026) | - | - | (382,177,026) |
| අනෙක් මෙහෙයුම් හා පරිපාලන වියදම් | (23,453,028) | (5,863,257) | (11,726,514) | (23,843,495) | (70,359,083) | (5,863,257) | (141,108,634) |
| මූල්‍ය පිරිවැය | (11,343) | (15,251) | (16,640) | (8,402,225) | (13,616) | - | (8,459,075) |
| **මුළු ප්‍රතිලාභ හිමිකම් ඉල්ලීම් සහ වියදම්** | **(140,100,623)** | **(91,585,777)** | **(32,473,977)** | **(416,754,582)** | **(1,215,829,533)** | **(16,299,905)** | **(1,913,044,397)** |
| | **23,422,608** | **(46,874,376)** | **703,148,986** | **2,543,663,009** | **203,265,819** | **814,221,195** | **4,240,847,242** |
| ආදායම් බදු වියදම් | - | - | - | | - | - | - |
| **ඒකාබද්ධ අරමුදලට ලබා දුන් දායකත්වය** | | | | (2,490,000,000) | | (710,000,000) | (3,200,000,000) |
| **වසරේ ලාභ/අලාභ** | **23,422,608** | **(46,874,376)** | **703,148,986** | **53,663,009** | **203,265,819** | **104,221,195** | **1,040,847,242** |



# 10. විගණක වාර්තාව

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. 1/13/25 | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2015 ජූලි 20 දින

සභාපති,
ජාතික රක්ෂණ භාර අරමුදල.

**ජාතික රක්ෂණ භාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

ජාතික රක්ෂණ භාර අරමුදලේ 2013 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ13(1) වගන්තිය සහ 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 17 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාරව අරමුදලේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මුදල් පනතේ 13(7)(ඒ) වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් අරමුදලේ සභාපති වෙත 2014 දෙසැම්බර් 12 දින නිකුත් කරන ලදී.

1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය නීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 | +94-11-2887223 | oaggov@sltnet.lk | www.auditorgeneral.gov.lk

2

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය නිර්ණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.4 අහිතකර මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2.3 (අ), (ආ) සහ 2.2.5 ඡේදවල දක්වා ඇති කරුණුවලට ගැලපීම් කර තිබුණේ නම් අනුගාමී මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බොහොමයක් මූලිකාංගවලට ප්‍රමාණාත්මක ලෙස බලපෑ හැකිව තිබුණි.

3

2.1 [illegible] මතය

මගේ මතයෙන් 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල වැදගත් බව හේතුවෙන් 2013 දෙසැම්බර් 31 දිනට ජාතික රක්ෂණ භාර අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු නොකරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම්කරණ සහ විගණන ප්‍රමිති පනත ප්‍රකාරව, 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, නව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල වෙමින් පිළියෙල කළ යුතු වුවද, මූල්‍ය ප්‍රකාශන ඊට අනුකූලව පිළියෙල කර ඉදිරිපත් කර නොතිබූ අතර, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට සංක්‍රාන්ති වීමක් සිදු වී නොතිබීම හේතුවෙන් මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වගකීම්, සාධාරණ වටිනාකමකට වර්ගීකරණය හා ධාරණ වටිනාකම අනුව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීම කර නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 01 අනුව අස්ථිත්වයක් විසින් ප්‍රමිතියක් මඟින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් සහ වගකීම් හිලව් නොකළ යුතු වුවද, බැංකු ගිණුම් 13 ක එකතුව රු.360,514,789 ක් වූ බැංකු ශේෂ බැංකු ගිණුම් 02 ක එකතුව රු.55,162,561 ක් වූ බැංකු අයිරා ශේෂවලට හිලව් කර දක්වා තිබුණි.

4

(ආ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 16 අනුව අරමුදල සතු දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කළ යුතු වුවද, ඵලදායි ජීවිත කාලය අවසන් වී ඇති වත්කම්වලට භාවිතයට ගනු ලබන පිරිවැය රු.9,578,750 ක් වූ වාහන දෙකක ප්‍රත්‍යාගණිත වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

2012 වර්ෂය සඳහා පාරිතෝෂික වෙන් කිරීම සිදුකර තිබුණේ වසර 5 ක අඛණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණු නිලධාරීන් සඳහා පමණක් වුවද, 2013 වර්ෂයේ වසරක සේවා කාලයක් සම්පූර්ණ කර තිබුණු නිලධාරීන් සඳහා ද පාරිතෝෂික වෙන් කිරීම කර තිබුණි. මේ හේතුවෙන් 2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී පාරිතෝෂික වෙන් කිරීම්වල රු.5,072,504 ක වැඩිවීමක් නිරීක්ෂණය වුවද, පාරිතෝෂික වෙන් කිරීම සම්බන්ධව ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 8 හි 28 ඡේදය අනුව හෙළිදරව් කළ යුතු තොරතුරු කිසිවක් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

### 2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අරමුදල විසින් විදේශ රැකියාවල නියුක්ත වූවන් සඳහා හඳුන්වා දී තිබූ රක්ෂණ ක්‍රමය 2012 අප්‍රේල් 28 දින සිට නවතා තිබුණද, 2012 මැයි මාසයේ සිට 2014 අගෝස්තු මාසය දක්වා එම රක්ෂණ ක්‍රමය වෙනුවෙන් එකතුව රු.219,928,591 ක් වූ වන්දි ඉල්ලීම් අනෙකුත් රක්ෂණ ක්‍රම යටතේ ලද වාරික ආදායම් භාවිතා කරමින් ගෙවා තිබුණි.

(ආ) 2012 වර්ෂයේදී බැංකු ගිණුමක දෙසැම්බර් 31 දිනට පැවති රු.7,215,904 ක් වූ මුදල් පොතේ ශේෂය හා එදිනට රු.1,251,008 ක් ලෙස බැංකු සැසඳුම් ප්‍රකාශයේ සඳහන් මුදල් පොතේ ශේෂය අතර රු.5,964,896 ක වෙනසක් පැවති අතර, එම වෙනස සමාලෝචිත වර්ෂයේ දී සමුච්චිත අරමුදලට ගලපා තිබීම හේතුවෙන් සමුච්චිත අරමුදල රු.5,964,896 කින් අඩුවෙන් දක්වා තිබුණි.

5

### 2.2.4 නොසැසඳූ පාලන ගිණුම්

බැංකු ගිණුම් 4 ක ශේෂ පිරික්සුම්/ මූල්‍ය ප්‍රකාශනවල සඳහන් බැංකු ශේෂ හා බැංකු සැසඳුම් ප්‍රකාශනවල සඳහන් ශේෂ අතර රු.38,500,000 ක හර හා රු.26,288,162 ක බැර ශේෂ වෙනස්කම් පැවතුණි.

### 2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් එක් එක් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් ඒවා විගණනයේදී සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය.

| | විෂය | වටිනාකම | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|---|
| | | රු. | |
| (i) | අයකැපූ ලැබිය යුතු මුදල් | 871,139,458 | ශේෂ සනාථ කිරීමේ ලිපි විස්තරාත්මක උපලේඛන කාල විශ්ලේෂණ |
| (ii) | අයකැපූ ගෙවිය යුතු මුදල් | 31,174,057 | |
| (iii) | ගෙවිය යුතු රක්ෂණ වන්දි | 273,060,335 | |
| (iv) | ඉතිරිකිරීමේ ගිණුම් | | |
| | මහජන බැංකුව | 20,404,203 | ගිණුම් පාස් පොත |
| | පැන් ඒෂියා බැංකුව | 1,191,137 | ගිණුම් පාස් පොත හා ශේෂ සනාථ කිරීමේ ලිපි |
| (v) | ජංගම ගිණුම් | | |
| | මහජන බැංකුව | 22,913,768 | බැංකු සැසඳුම් ප්‍රකාශන |
| | මහජන බැංකුව | (54,516,844) | |
| | මහජන බැංකුව | 137,478,867 | ශේෂ සනාථ කිරීමේ ලිපි හා බැංකු සැසඳුම් ප්‍රකාශන |

6

2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

අරමුදල යටතේ ක්‍රියාත්මක වන වැඩ වර්ජන , කැරලි කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදලේ 2008 වර්ෂයට අදාලව ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවට ගෙවිය යුතුව තිබෙන ලාභ කොමිස් රු.12,287,375 ක් 2010 වර්ෂයේ සිට නිරවුල් නොකොට විගණිත දිනය වූ 2014 ඔක්තෝබර් 31 දින වන විටත් පැවතුණි.

2.4 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

විගණනයේදී පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති, රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල් පනතේ 6 (1) ඡේදය | තොරතුරු විෂයය පවරනු ලබන අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයෙන් නිලධාරියෙක් පත් කළ යුතු වුවද, 2015 ජනවාරි 15 දින දක්වා එම නිලධාරියා පත්කර නොතිබුණි. |
| (ආ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.14 පරිච්ඡේදය | අරමුදල විසින් පරිපාලන අත්පොතක් පිළියෙල කර අනුමත කරවා ගෙන නොතිබුණි. |
| (ඇ) | රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ අංක පීඊඑෆ්/සමීක්ෂණ මණ්ඩල / 01 හා 2010 දෙසැම්බර් 17 දිනැති ලිපිය මඟින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර එම වාර්තා පසු වර්ෂයේ මාර්තු 15 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද වාර්තාව ඉදිරිපත් කර තිබුණේ 2014 දෙසැම්බර් 29 දිනදීය. |

7

(ඈ) 2011 සැප්තැම්බර් 15 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 58 (2) හි 3.1 ඡේදය

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් සඳහා දීමනා ගෙවීමේදී මාසයට 10 ක රැස්වීම් ගැනීමේ සීමා කල යුතු බව සඳහන් වුවද අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයෙකු වෙත ගෙවනු ලබන දීමනාවෙන් එසේ අඩු කිරීම සිදුකර නොතිබුණි.

(ඉ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය

(i) මුදල් රෙගුලාසි 102/104

අරමුදල විසින් 2013 ජූලි 15 දින සිදු කර තිබුණු භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වී තිබුණු අයිතම 69 ක ඌනතා සම්බන්ධව රෙගුලාසි ප්‍රකාරව ක්‍රියාකර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 (2) (ආ)

දෙන ලද අතුරු අග්‍රිමයන් එය දෙන ලද කාර්යය නිම කළ විගසම පියවිය යුතු වුවද, අවස්ථා 4 කදී ගෙවන ලද රු.23,000 ක් වූ අත්තිකාරම් පියවීම දින 30 ක පමණ කාලයක් ප්‍රමාද වී තිබුණි.

(iii) මුදල් රෙගුලාසි 371 (5) ඡේදය

අතුරු අග්‍රිම ශේෂය පියවීම එම අග්‍රිමය නිකුත් කරන ලද මුදල් වර්ෂයේ දෙසැම්බර් 31 වැනි දිනට වැඩියෙන් ප්‍රමාද නොකළ යුතු වුවත් අවස්ථා 7 ක දී දෙන ලද එකතුව රු.86,000 වූ අග්‍රිම ශේෂ 2013 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

(iv) මුදල් රෙගුලාසි 396 (ඇ)

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට නිකුත් කළ දින සිට මාස 6 ක් ඉක්මවූ ඉදිරිපත් නොකළ රු.44,541,842 ක් වූ චෙක්පත් 20 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා අරමුදලේ මෙහෙයුම් කටයුතුවලින් වූ මූල්‍ය ප්‍රතිඵලය රු.4,240,847,242 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.2,083,023,166 ක් වූයෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.2,157,824,076 ක වැඩිවීමක් දක්නට ලැබුණි. මේ සඳහා රක්ෂණ වාරික ශුද්ධ ආදායම, අනුග්‍රාහක දායකත්ව ලැබීමේ හා වෙනත් රක්ෂණ ආදායම් පිළිවෙලින් රු.1,048,026,316 ක්, රු.543,271,321 ක් හා රු.440,836,600 ක වැඩිවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 3.2 විශ්ලේෂණාත්මක මූල්‍ය සමාලෝචනය

අරමුදල යටතේ ක්‍රියාත්මක වන වැඩවර්ජන, කෝලාහල, සිවිල් අරගල සහ ත්‍රස්තවාදී අරමුදල සඳහා ලැබෙන ආදායම් අරමුදලේ ප්‍රධාන ආදායම් මූලාශ්‍රය වන අතර යුද්ධය අවසන් වීමත් සමඟ එම ක්‍රියා සඳහා වූ රක්ෂණ ආවරණය සඳහා ඇති ඉල්ලුම අඩුවීමත් එහි ත්‍රස්තවාදී ක්‍රියාවලට අදාළව අය කරනු ලබන ප්‍රතිශතයේ සංශෝධනය කිරීමත් සමඟ අරමුදල සඳහා ලැබෙන වාරික ආදායම 2010 වර්ෂයේ රු.3,926,469,856 ක් වූ අතර එම ප්‍රමාණය 2013 වර්ෂය වන විට රු.2,543,930,179 දක්වා ප්‍රමාණාත්මක ලෙස අඩු වී තිබුණි.

කොටස් ප්‍රාග්ධනයක් නොමැතිව ක්‍රියාත්මක වන මෙම අරමුදලෙන්, ඒකාබද්ධ අරමුදල සඳහා ලබා දී තිබූ දායකත්වය හේතුවෙන් සමුච්චිත අරමුදලේ ශේෂය අඩුවීම සඳහා පිළියමක් ලෙස 2011 මාර්තු 11 දින පැවැත්වූ 58 වැනි අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී සමුච්චිත අරමුදල සඳහා රුපියල් බිලියන 10 ක වෙනමම සංචිතයක් පවත්වා ගත යුතු බවට තීරණය කර තිබුණි. එහෙත් පසුගිය වර්ෂ තුළදී එම සංචිතය හෝ සමුච්චිත අරමුදලේ අවම ශේෂය හෝ පවත්වා ගැනීමට අරමුදල අපොහොසත් වී තිබුණි. 2010 වර්ෂයේ සමුච්චිත අරමුදලේ රු.9,695,467,155 ක් වූ ශේෂය සමාලෝචිත වර්ෂය වන විට රු. 6,942,528,728 දක්වා අඩු වී තිබුණි.

3.3 [illegible]

2010 ජූලි 27 වන දින කොන්ත්‍රාත් පදනම මත සය මාසික කාලයක් සඳහා වයස අවුරුදු 68 ඉක්මවා සිටි පුද්ගලයෙකු සහකාර කළමණාකරුවෙකු (විනය හා වන්දි විමර්ශන) ලෙස බඳවා ගෙන තිබුණි. 2010 ජූනි 22 දින පැවති සම්මුඛ මණ්ඩල නිර්දේශ මත සිදු නිවැරදි සිම්හෝරාන පරිදි හා කාර්යය පැවරුම් අනුව දීමනා ගෙවීම මත ඉහත කී පුද්ගලයා විමර්ශන නිලධාරියෙකු ලෙස බඳවා ගැනීම නිර්දේශ කර තිබුණි. එසේම රු.27,500 ක මාසික වැටුපක් සහ අනෙකුත් වරප්‍රසාද සපයමින් විධිමත් අනුමැතියකින් තොරව මෙම සැකැස්ම පරිපාලන හා මානව සම්පත් උපදේශක තනතුරකට බඳවා ගෙන තිබුණු අතර ඔහුගේ ඉල්ලීම මත බඳවා ගත් දින සිට 2014 දෙසැම්බර් 31 දින දක්වා මාස 6 න් 6 ට කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්යසාධනය

අරමුදල විසින් ක්‍රියාත්මක කර තිබූ එක් එක් අංශය මගින් ඉටු කරන ලද කාර්යයන්වල ප්‍රගතිය පහත දක්වා ඇත.

(අ) ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ ලියාපදිංචි වී රැකියා සඳහා විදේශගතවන ශ්‍රී ලාංකිකයින් සඳහා අරමුදල විසින් රක්ෂණ ක්‍රමයක් හඳුන්වා දී තිබුණු අතර ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ අරමුදල අතර ඇති කර ගත් අවබෝධතා ගිවිසුමකට අනුව අරමුදල විසින් 2008 ජූනි 01 දින සිට 2012 අප්‍රේල් 28 දින තෙක් එය ක්‍රියාත්මකව පැවතුණි. මේ යටතේ එම කාලපරිච්ඡේදය තුළ එකතුව රු.247,378,731 ක ශුද්ධ ආදායමක් උපයා ගෙන තිබුණි. ගිවිසුමේ එක් පාර්ශවකරුවෙකු වන ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් අදාළ ගිවිසුම අවසන් කරන බව 2012 මාර්තු 30 දින අරමුදලට දන්වා තිබීම මත මෙම රක්ෂණ ක්‍රමය මේ වනවිට නවතා දමා තිබුණි. කෙසේ වුවද, අරමුදලට වාසිදායක වන අයුරින් ක්‍රියාත්මක වූ මෙම රක්ෂණ ක්‍රමය ඉදිරියට පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් අදාළ පාර්ශවයන් සමඟ සාකච්ඡා කර අවශ්‍ය වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට අරමුදල කිසිදු උත්සාහයක් ගෙන නොතිබුණි.

10

(ආ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා සෞඛ්‍ය රක්ෂණ ක්‍රමයක් අරමුදල මගින් හඳුන්වා දී තිබුණු අතර එහි වාර්ෂික රක්ෂණ වාරික මුදල් තීරණය කරනු ලැබුවේ අරමුදල විසින් වුවද, ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2012 හා 2013 වර්ෂවල අය කරනු ලැබූ වාර්ෂික රක්ෂණ වාරික මුදල ඉක්මවා එකතුව රු.7,898,710 ක ප්‍රතිලාභ ගෙවා තිබුණි.

(ඇ) වී ගොවීන්ගේ වගාවන්ට නියඟයෙන්, ගංවතුරෙන් සහ වන අලින්ගෙන් සිදු වන හානිවලින් ආරක්ෂා කර ගැනීමේ අරමුණින් 2013 වර්ෂයේ අයවැය යෝජනාවක් අනුව අරමුදල විසින් වගා රක්ෂණය හඳුන්වා දී තිබුණු අතර මේ සම්බන්ධව අංක BD/FE/118/01/BP/2013 හා 2013 ජූනි 21 දිනැති අයවැය චක්‍රලේඛය මගින් සියලුම වී ගොවීන් රක්ෂණය වීම අනිවාර්යය කර තිබුණි. ගොවීන් විසින් පොහොර මිලදී ගැනීමේ දී එයට අදාළ වාරික මුදල් අයකර ගැනීම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් සහ සමුපකාර සමිති වලින් සිදු කරනු ලබන අතර එසේ අයකරනු ලබන මුදල් සතිපතා ජාතික රක්ෂණ භාර අරමුදලේ ගිණුමකට තැන්පත් කළ යුතු වුවද, ගොවීන්ගෙන් අයකර ගනු ලබන සියලු මුදල් සතිපතා බැංකුගත කිරීමක් සිදු කරන්නේ දැයි තහවුරු කර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් අරමුදල හඳුන්වා දී නොතිබුණි. එසේම, මහා කන්නයේ නියඟයෙන් වගාවන්ට හානි සිදුවීම හේතුවෙන් 2014 සැප්තැම්බර් 16 දින වන විට අරමුදල වෙත ලැබී තිබුණු වන්දි ඉල්ලුම්පත්‍ර 68,359 කින් අයදුම්පත් 15,240 ක පමණක් ගෙවීම් අවසන් කර තිබුණු අතර තවත් අයදුම්පත් 53,119 ක ගෙවීම් සිදු කිරීමට තිබීම හේතුවෙන් මෙම වගා රක්ෂණ ක්‍රමය කෙරෙහි සමා ඇති විශ්වාසය පළුදු වන බවත් එම නිසා මේ මගින් අපේක්ෂිත අරමුණු ඉටු නොවන බවත්, නිරීක්ෂණය විය.

(ඈ) අරමුදල විසින් ක්‍රියාත්මක කර තිබූ අග්‍රහාර රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ දී සහ දායක මුදල් අයකර ගැනීමේ දී විවිධ ආයතනවලින් කරනු ලබන ප්‍රේෂණයන්ගේ නිවැරදිභාවය තහවුරු කර ගැනීමේ විධිමත් ක්‍රමවේදයක් හඳුන්වා දී නොතිබුණු අතර දායක මුදල් අඛණ්ඩව අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ද ගෙන නොතිබුණි. එසේම සේවා ආයතනවල නියුක්තිකයන් සියල්ලන්ම මෙම රක්ෂණ ක්‍රමය යටතේ සාමාජිකත්වය ලබා ගෙන ඇත්ද යන්න පරීක්ෂා කිරීමට අවශ්‍ය පියවරයන් ද ගෙන නොතිබුණි.

(ඉ) අරමුදල විසින් 2008 වර්ෂයේ සිට සියළු රජයේ ආයතන හා [illegible] වාහන රක්ෂණය ද 2009 සැප්තැම්බර් 01 දින සිට පෞද්ගලික වාහන රක්ෂණයන් ද ආරම්භ කර තිබුණු අතර 2009 සැප්තැම්බර් 18 දිනැති අංක PF 437 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් සියළුම රාජ්‍ය සහ අර්ධ රාජ්‍ය ආයතන තම අධිකාරයන්ගේ අලුත් මෝටර් රථ රක්ෂණය ජාතික රක්ෂණ භාර අරමුදල හා ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව වෙතින් පමණක් සලසා ගත යුතු බව පෙන්වා දී තිබියදීත්, එයට පටහැණිව 2013 පෙබරවාරි 18 දින පැවති අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී රාජ්‍ය ව්‍යාපාර හැර අනෙකුත් ආයතනවල මෝටර් රථ රක්ෂණයට පමණක් මෙම රක්ෂණ කටයුතු සීමා කිරීමට තීරණය කර තිබුණි. විගණනයට ඉදිරිපත් කළ තොරතුරු අනුව, 2009 වර්ෂයේ සිට 2013 දක්වා රක්ෂණය කරන ලද රජයේ හා පෞද්ගලික වාහන සංඛ්‍යාව හා ඉන් ලද රක්ෂණ වාරික ආදායම සැසඳීමේදී 2009 වර්ෂයට සාපේක්ෂව 2013 දක්වා රක්ෂණය කරන ලද රජයේ වාහන සංඛ්‍යාව 7321 කින් එනම් සියයට 45 කින් හා වාර්ෂික ආදායම රු.මිලියන 158 කින් අඩු වී තිබුණු අතර රක්ෂණය කරන ලද පෞද්ගලික වාහන සංඛ්‍යාවද 2011 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේදී වාහන සංඛ්‍යාව 2736 කින් හා ආදායම රු.මිලියන 9 කින් අඩු වී තිබුණි.

## 5.5 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට අරමුදලේ අනුමත කාර්ය මණ්ඩලය, සත්‍ය හා පුරප්පාඩු සංඛ්‍යාව පහත පරිදි විය.

| විස්තරය | අනුමත සංඛ්‍යාව | සත්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 02 | 10 |
| තෘතියික මට්ටම | 16 | 16 | 0 |
| ද්විතියික මට්ටම | 144 | 126 | 18 |
| ප්‍රාථමික මට්ටම | 24 | 18 | 06 |
| එකතුව | 196 | 162 * | 34 |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දින වන විට අරමුදලේ මුළු පුරප්පාඩු සේවක සංඛ්‍යාව 34 ක් එනම් අනුමත තනතුරුවලින් සියයට 17 ක් විය. මේ තුළ අරමුදලේ ප්‍රධාන විධායක නිලධාරියාද ඇතුළුව ඉහළ කළමනාකාරීත්වයේ තනතුරු 10 ක පුරප්පාඩු පැවතුණි.

(ආ) කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 30 විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අංක DMS /C2/2/44 හා 2012 සැප්තැම්බර් 07 දිනැති ලිපිය මගින් අරමුදල සඳහා වූ සේවක සංඛ්‍යාව අනුමත කර තිබුණද, එදින සිට වර්ෂ 02 ක කාලයක් ඉක්මවී ඇතත් ඉහත පුරප්පාඩු සඳහා සුදුස්සන් තෝරා ගැනීමට අරමුදල ක්‍රියා කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශීය ශාඛා කළමනාකරු තනතුරක් ද ඇතුළුව තනතුරු 09 ක් විධිමත් අනුමැතියකින් තොරව තාවකාලික පත්වීම් මගින් සම්පූර්ණ කර තිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 6.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඩී 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 ඡේදයට අනුව, මූල්‍ය වර්ෂය අවසාන වී දින 60 ක් ඇතුළත කෙටුම්පත් වාර්ෂික වාර්තාව හා මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කළ යුතු වුවද, 2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කර තිබුණේ 2014 ජූනි 30 දිනදීය.

### 6.2 අයවැය ලේඛනමය පාලනය

අයවැයගත වියදම් හා සත්‍ය වියදම් අතර සියයට 29 සිට සියයට 2557 දක්වා වූ පරාසයක විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී මූල්‍ය කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

13

## 6.3 අභ්‍යන්තර විගණනය

අරමුදලට අයවීම කළ දින සිට කළමනාකරු (අභ්‍යන්තර විගණන) තනතුර පුරප්පාඩු ව පැවැති අතර එම අංශයට අනුයුක්ත කර තිබූ නිලධාරීන්ද අනුමත රක්ෂණ අංශයේ ප්‍රතිලාභ ගෙවීම්වල නිරවද්‍යතාවය පරීක්ෂා කිරීම වැනි එක් ක්ෂේත්‍රයක කටයුතු පමණක් ආවරණය කරමින් පැවැතුණි. මේ නිසා අරමුදලේ අභ්‍යන්තර විගණනය තව දුරටත් දුර්වලව පැවතුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කර ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

(i) රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම
(ii) වත්කම් කළමනාකරණය
(iii) ගිණුම්කරණය
(iv) කාර්ය මණ්ඩල පරිපාලනය
(v) අත්තිකාරම් ලබාදීම

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩ බලන)



# 11.අට වසරක අවලෝකනය

# අට වසරක අවලෝකනය- මූල්‍ය කාර්යසාධනය

*සියළු සංඛ්‍යා ශ්‍රී ලංකා රුපියල් වලිනි*

| *දෙසැම්බර් 31 න් අවසන් වසර සඳහා* | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 | 2006 |
|---|---|---|---|---|---|---|---|---|
| **ආදායම** | | | | | | | | |
| ශුද්ධ වාරික ඉපයුම් ආදා | 5,452,318,662 | 3,886,183,341 | 3,606,365,031 | 3,926,469,856 | 4,019,486,220 | 3,427,950,662 | 2,654,902,681 | 318,902,642 |
| **ප්‍රතිලාභ හානි හා වියදම්** | | | | | | | | |
| රක්ෂණ හිමිකම් සහ ප්‍රති | -1,763,476,689 | -2,281,470,751 | -1,879,486,696 | -2,292,072,983 | -2,075,936,806 | -1,736,355,732 | -1,423,044,038 | -242,465,993 |
| | 3,688,841,974 | 1,604,712,590 | 1,726,878,335 | 1,634,396,873 | 1,943,549,415 | 1,691,594,930 | 1,231,858,643 | 76,436,649 |
| **අනෙකුත් ආදායම්** | | | | | | | | |
| ආයෝජන ආදායම් | 691,492,020 | 615,813,544 | 723,412,241 | 798,117,037 | 1,364,459,074 | 1,205,463,441 | 528,264,787 | |
| මෘදු ණය මත පොලී | 5,915,955 | 7,278,316 | 10,163,846 | 16,982,331 | 15,125,027 | 19,424,829 | 38,713,576 | |
| අනෙකුත් ආදායම් | 4,165,001 | 18,886,182 | 743,614 | 1,006,353 | 471,787 | 917,841 | | |
| | 701,572,977 | 641,978,043 | 734,319,701 | 816,105,721 | 1,380,055,889 | 1,225,806,111 | 1,798,837,006 | 76,436,649 |
| **වියදම්** | | | | | | | | |
| කාර්යමණ්ඩලාශ්‍රිත පිරිව | 76,487,490 | 72,006,709 | 52,769,174 | 42,326,032 | 33,124,615 | 21,470,147 | 11,500,953 | 1,333,806 |
| පරිපාලන වියදම් | 64,621,143 | 74,402,484 | 72,147,229 | 45,136,006 | 49,246,381 | 28,264,346 | 14,142,950 | 1,508,940 |
| මූල්‍ය සහ අනෙකුත් වියද | 8,459,075 | 17,258,273 | 21,581,925 | 32,425,697 | 38,401,103 | 5,380,035 | 3,385,205 | 138,170 |
| **මුළු වියදම්** | 149,567,708 | 163,667,466 | 146,498,329 | 119,887,735 | 120,772,099 | 55,114,528 | 29,029,109 | 2,980,916 |
| බදු | | | 108,349,446 | | | | | |
| වියදම ඉක්මවූ ආදායම | 4,240,847,242 | 2,083,023,166 | 2,206,350,261 | 2,330,614,859 | 3,020,833,203 | 2,862,286,514 | 1,769,807,897 | 73,455,733 |

# අට වසරක අවලෝකනය

# - මූල්‍ය තත්වය

*(All Figures in Sri Lankan Rupees)*

| *for the year ended December 31,* | 2013 | 2012 | 2011 | 2010 | 2009 | 2008 | 2007 |
|---|---|---|---|---|---|---|---|
| **Assets** | | | | | | | |
| **Non - Current Assets** | | | | | | | |
| Property , plant and equipment | 19,317,968 | 24,739,202 | 29,606,877 | 36,096,011 | 43,603,504 | 44,659,781 | 25,240,465 |
| Investments | 6,667,518,021 | 5,375,914,672 | 4,444,546,262 | 5,574,107,464 | 8,550,206,721 | 7,749,178,616 | 5,449,343,240 |
| | 6,686,855,988 | 5,400,653,874 | 4,474,153,140 | 5,610,203,475 | 8,593,810,225 | 7,793,838,397 | 5,474,583,705 |
| **Current Assets** | | | | | | | |
| Receivables | 1,686,049,990 | 1,664,647,836 | 1,927,814,565 | 1,945,815,895 | 2,079,570,419 | 1,988,501,988 | 2,221,955,826 |
| Cash and cash equivalents | 305,495,813 | 103,641,397 | 3,542,969,945 | 3,594,104,553 | 110,173,003 | 239,795,258 | 560,259,122 |
| | | 1,768,289,233 | 5,470,784,510 | 5,539,920,448 | 2,189,743,421 | 2,228,297,246 | 2,782,214,948 |
| **Total Assets** | **8,678,381,792** | 7,168,943,107 | 9,944,937,649 | 11,150.123,923 | 10,783,553,646 | 10,022,135,643 | 8,256,798,653 |
| **Equity and liability Equity** | | | | | | | |
| Accumulated fund | 6,950,664,274 | 5,912,918,517 | 8,497,449,707 | 9,695,467,155 | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 |
| | 6,950,664,274 | 5,912,918,517 | 8,497,449,707 | 9,695,467,155 | 9,364,852,783 | 8,412,019,580 | 6,583,508,929 |
| **Technical Reserves** | | | | | | | |
| Unearned Premium | 1,622,656,295 | 1,059,398,308 | 963,443,837 | 821,564,804 | 1,046,825,276 | 1,063,317,772 | 877,695,727 |
| Deferred Commission | (199,173,169) | (176,532,688) | (161,486,715) | (139,745,300) | (200,139,536) | (206,999,340) | (161,317,228) |
| | 1,423,483,136 | 882,865,620 | 801,957,122 | 681,819,505 | 846,685,740 | 856,318,432 | 716,378,499 |
| **Liability** | | | | | | | |
| **Non-current Liabilities** | | | | | | | |
| Government grant | 66,960 | 66,960 | 142,150 | 284,330 | 719,190 | 719,190 | 719,190 |
| Profit Commission payable | 12,287,375 | 12,287,375 | 12,287,375 | 12,287,375 | 63,762,150 | 113,635,474 | 83,722,067 |
| | 12,354,336 | 12,354,336 | 12,429,525 | 12,571,705 | 64,481,340 | 114,354,664 | 84,441,257 |
| Current Liabilities | | | | | | | |
| Claim Payable | 273,060,335 | 286,078,050 | 392,410,772 | 518,000,207 | 329,499,921 | 333,321,632 | 602,777,397 |
| Other Payables | 1,881,972 | 74726585 | 240,690,522 | 242,265,350 | 178,033,863 | 306,121,335 | 269,692,571 |
| | 291,880,056 | 360,804,635 | 633,101,294 | 760,265,557 | 507,533,784 | 639,442,967 | 872,469,968 |
| Total equity and liability | 8,678,381,792 | 7,168,943,108 | 9,944,937,649 | 11,150,123,923 | 10,783,553,647 | 10,022,135,643 | 8,256,798,653 |



# 12 සමායතනික තොරතුරු

❖ **ආයතනයේ නම :**

ජාතික රක්ෂණ භාර අරමුදල

❖ **නෛතික ආකෘතිය :**

2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනත යටතේ ස්ථාපිත ව්‍යවස්ථාපිත ආයතනයකි.

❖ **ලේඛනගත කාර්යාලය :**

ජාතික රක්ෂණ භාර අරමුදල

අංක 97, මරදාන පාර,

කොළඹ - 10.

❖ **විගණකවරු :**

විගණකාධිපති

❖ **බැංකුකරුවෝ**

මහජන බැංකුව, ලංකා බැංකුව සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව